17 AUG 2005

සමාගම් රෙජිස්
දෙපාර්තමේන්තුව
25 AUG 2005
ශ්‍රී ලංකා

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 11 දරන සමිති ආඥාපනත (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2005 මැයි මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 මැයි මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 4.25 යි.

තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

Pl. submit with the file

2005 අංක 11 දරන සමිති ආඥාපනත (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2005 මැයි මස 06 වන දින]

එල්. ඩී.– ඕ. 101/2002.

සමිති ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2005 අංක 11 දරන සමිති ආඥාපනත (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

කෙටි නාමය.

2. (123 වන අධිකාරය වූ) සමිති ආඥාපනතේ (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

123 වන අධිකාරයේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "සමිතියේ අභිමතය පරිදි" සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති වචන වෙනුවට "දියා අධිකරණයේ පවරන නඩුවකින් අයකර ගනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "දෙදහස් පන්සියයක්" යන වචන වෙනුවට "ලක්ෂ පහක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "දෙදහස් පන්සියයක්" යන වචන වෙනුවට "ලක්ෂ පහක්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ (8) වන උපවගන්තියේ "වයස අවුරුදු විසිඑකට අඩු එහෙත් වයස අවුරුදු දහයයට වැඩි" යන වචන වෙනුවට "වයස අවුරුදු දහඅටට අඩු එහෙත් වයස අවුරුදු දහසයට වැඩි" යන වචන ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ "මුළු මුදල වශයෙන් රුපියල් දෙදහසකට වැඩි මුදලක් සහ යම් බෝනස් මුදලක් හෝ ඒ මුදලට වැඩි නොවන රක්ෂණ මුදල් මත ප්‍රකාශයට පත් කරන ලද එකතු කළ මුදලක් හෝ වාර්ෂික මුදල් වශයෙන් රුපියල් පන්සියයක්" යන වචන වෙනුවට "මුළු මුදල වශයෙන් රුපියල් විසිපන් දහසකට වැඩි මුදලක් සහ යම් බෝනස් මුදලක් හෝ එකී මුදලට වඩා වැඩි නොවන, රක්ෂණය මත ප්‍රකාශයට පත් කරන ලද මුදලක් හෝ වර්ෂයකට රුපියල් පන්දහසක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

4 මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

2–P. L. 000068–4,500 (2005/02)

# 123 වෙනි අධිකාරය

# සමිති

අන්‍යොන්‍යාධාර, අර්ථසාධක සහ වෙනත් සමිති ලියාපදිංචි කිරීමට විධිවිධාන සැලසීම සඳහා වූ ආඥාපනතකි.

ආඥාපනත්:
1891 අංක 16
1925 අංක 17
1932 අංක 14
පනත්:
1949 අංක 55

[1891 දෙසැම්බර් 18]

1. මේ ආඥාපනත සමිති ආඥාපනත නමින් හැඳින්විය හැකි ය. — ලුහුඬු නාමය.

2. මේ ආඥාපනතෙහි පද සංසන්දනය අනුව වෙනත් ගැලපෙන්නේ නැතහොත් පහත සඳහන් යෙදුම්වලට මෙහි පහත පිළිවෙළින් දී ඇති අර්ථ විය යුතු ය:— — අර්ථ නිරූපණය.

"ව්‍යවස්ථා සංශෝධනය" යන්නට අලුත් ව්‍යවස්ථාවක් ද ව්‍යවස්ථාවක් අවලංගු කරන්නා වූ සම්මත යෝජනාවක් ද ඇතුළත් විය යුතු ය;

"කාරක සභාව" යන්නෙන් සමිතියක කළමනාකාර කාරක සභාව හෝ සෙසු විධායක මණ්ඩලයක් අදහස් විය යුතු ය;

"රැස්වීම" යන්නට (සමිතියක ව්‍යවස්ථාවලින් එසේ ඉඩ දී ඇති විට) සාමාජිකයන් විසින් පත් කරනු ලැබූ නියෝජිතයන්ගේ රැස්වීමක් ද ඇතුළත් විය යුතු ය;

"නිලධාරියා" යන්නට යම් භාරකරුවකු, භාණ්ඩාගාරිකයකු, ලේකම්වරයකු, කාරක සභිකයකු, කළමනාකරුවකු හෝ සමිතියේ කාරක සභාව විසින් පත් කරනු ලැබූ සේවකයකු නොවන සේවකයකු ද ඇතුළත් විය යුතු ය;

"සාමාජිකයකුගේ මාර්ගයෙන් හිමිකම් කියන තැනැත්තා" යන්නට උරුමක්කාරයන්, මුදල් බලකරුවන්, පරිපාලකයන් සහ සාමාජිකයකුගේ පැවරුම්කරුවන් ද, නාම යෝජනා ඉඩ දී ඇති විට ඔහු විසින් නම් කරනු ලැබූවන් ද ඇතුළත් විය යුතු ය;

"දේපළ" යන්නෙන් (පොත් සහ ලියවිලි ඇතුළත්ව) සියලුම චංචල සහ නිශ්චල දේපළ අදහස් විය යුතු ය;

"ලියාපදිංචි කළ සමිතිය" යන්නෙන් මේ ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ ලියාපදිංචි කර ඇතැයි සැලකෙන්නා වූ සමිතියක් අදහස් විය යුතු ය;

"රෙජිස්ට්‍රාර්" යන්නෙන් සමාගම් රෙජිස්ට්‍රාර් අදහස් කෙරෙන අතර, මේ ආඥාපනත යටතේ රෙජිස්ට්‍රාර්ගේ යුතුකම් ඉටු කිරීම පිණිස සමාගම් රෙජිස්ට්‍රාර් විසින් බලය පවරනු ලැබිය හැකි, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ යම් නිලධාරියෙක් ද ඇතුළත් වේ;

"ව්‍යවස්ථා" යන්නෙන් තත්කාලීන ව්‍යවස්ථා අදහස් විය යුතු ය.

1*—ආර 6190—2,850 (62/11) ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

ලියාපදිංචි කළ හැකි සමිති.

3. පහත සඳහන් සමිති මේ ආඥාපනත යටතේ ලියාපදිංචි කළ හැකි ය :—

(අ) සකසුරුවම්කම දියුණු කිරීම, රෝගී වූ හෝ විපත් අවස්ථාවන් හි දී සාමාජිකයන්ට සහනය සැලසීම, මුදල් අමාරුකම් වල දී ඔවුනට පිහිටවීම සහ ඔවුන්ගේ වැන්දඹුවන් සහ අනත් දරුවන් වෙනුවෙන් විධිවිධාන සැලසීම් පරමාර්ථ කොට ගෙන පිහිටුවන ලද (මෙහි "අන්‍යෝන්‍යාධාර අර්ථ සාධක සමිති" යි කියනු ලබන) සමිති ;

(ආ) මේ ආඥාපනතේ බලතල සහ පහසුකම් ව්‍යාප්ත කළ යුතු කාර්යයක් වශයෙන් ගැසට් පත්‍රයේ නිවේදනයක් පළ කිරීමෙන් ඇමතිවරයා විසින් බලය පැවරිය හැකි කිසියම් කාර්යයක් සඳහා වූ (මෙහි "විශේෂයෙන් බලය පැවරූ සමිති" යි කියනු ලබන) සමිති.

ආඥාපනත සීමාසහිත ව අදාළ කිරීම.

4. විශේෂයෙන් බලය පැවරූ සමිති සම්බන්ධයෙන් මේ ආඥාපනතේ අදාළවීම, මෙහි අන්තර්ගත විධිවිධාන අතුරින්, එවැනි යම් සමිතියක් ලියාපදිංචි කිරීමට බලය පවරන නිවේදනයෙහි විශේෂයෙන් නියම කොට දැක්විය හැකි විධිවිධානවලට, ඇමතිවරයා විසින් සීමා කරනු ලැබිය හැකි ය.

සමිති ලියාපදිංචි කිරීම.

5. සමිති ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන බල පැවැත්විය යුතු ය :—

(1) යටත් පිරිසෙයින් සත් දෙනකුගෙන් වත් සමන්විත නො වූ හා යටත් පිරිසෙයින් රුපියල් දස දාහක සහසාය ප්‍රාග්ධනයක් නොමැත්තා වූ සමිතියක් මේ ආඥාපනත යටතේ ලියාපදිංචි කළ නො හැකි ය.

(2) ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා, සමිතිය ලියාපදිංචි කරනු පිණිස වූ ඉල්ලුම් පත්‍රයක් සාමාජිකයන් සත් දෙනකු සහ ලේකම් විසින් අත්සන් කොට ව්‍යවස්ථාවන්ගේ ලිඛිත හෝ මුද්‍රිත පිටපත් දෙකක් ද සමග රෙජිස්ට්‍රාර් වෙත යැවිය යුතු ය.

(3) පවත්නා වූ වෙන යම් සමිතියක් ලියාපදිංචි කර ඇති නමක් ම වූ හෝ රෙජිස්ට්‍රාර්ගේ මතය අනුව සමිතියේ තද්භාවය පිළිබඳ ව මහජනයා මුළා විය හැකි පමණට ඒ නාමයට සමාන වූ හෝ නමක් යටතේ, කිසි ම සමිතියක් ලියාපදිංචි නො කළ යුතු ය ; එසේ ම, රෙජිස්ට්‍රාර්ගේ අනුමතිය නොමැති ව හෝ මෙහි මින් මතු ඉඩ සලසා තිබෙන අන් දමින් හැර අන් ලෙසකින් හෝ කිසිම සමිතියක් සිය නාම වෙනස් නො කළ යුතු ය.

(4) ලියාපදිංචි කරනු ලබන සෑම සමිතියක ම නාමයේ මුලට "සීමාසහිත" යන වචනය ද අගට "සමිතිය" යන වචනය ද යෙදිය යුතු ය.

(5) ලියාපදිංචි කිරීම පිළිබඳ ව මේ ආඥාපනත යටතේ වලංගු විධිවිධාන සමිතියක් විසින් පිළිපැද තිබේ ය යි රෙජිස්ට්‍රාර් සෑහීමට පත් වූ කල්හි ලියාපදිංචි කළ බවට ලිපියක් ඔහු විසින් ඒ සමිතියට නිකුත් කළ යුතු ය.

(6) රෙජිස්ට්‍රාර් යම්කිසි සමිතියක් නැතහොත් ව්‍යවස්ථා කිසිවක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඒ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධ ව ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකරුවන් වෙත ආයාචනා කිරීමට ඒ සමිතියට හැකි ය. ආයාචනා කිරීමේ ක්‍රමය, එය විභාග කිරීම හා අන් ලෙසකින් ඊට සම්බන්ධ කරුණු පිළිබඳ රීති හා නියෝගයන් ඒ විනිශ්චය කාරවරුන් විසින් පැනවිය හැකි ය.

(7) ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබීම ආයාචනයෙහි දී නිෂ්ප්‍රභ කරන ලද්දේ නම් එවිට රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කළ බවට ලිපියක් සමිතිය වෙත යැවිය යුතු ය.

(8) සමිතියේ ලියාපදිංචි කිරීම අත්හිටුවා හෝ අවලංගු කර තිබේ ය යි ඔප්පු කරනු ලැබුවහොත් මිස, ලියාපදිංචි කළ බවට ලැබුණු ලිපිය, ඒ ලිපියෙහි සඳහන් සමිතිය යථා පරිදි ලියාපදිංචි කර ඇති බවට තීරණාත්මක සාක්ෂිය විය යුතු ය.

**ලියාපදිංචි කිරීම අවලංගු කිරීම සහ අත්හිටුවීම.**

6. ලියාපදිංචි කිරීම අවලංගු කිරීම හෝ අත්හිටුවීම සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන බලපැවැත්විය යුතු ය:—

(1) සමිතියක ලියාපදිංචි කිරීමක්—

(අ) තමා විසින් කලින් කල නියම කරනු ලැබිය යුතු ආකාරයකින් සාක්ෂි දීමෙන් කෙරෙන සමිතියක ඉල්ලීමක් පිට සුදුසු ය යි තමාට පෙනේ නම්;

(ආ) ලියාපදිංචි කළ බවට ලිපියක් වංචාවෙන් හෝ වැරදීමකින් ලබා ඇත්තේ ය යි හෝ සමිතියක් නීති විරෝධී කාර්යයක් සඳහා පැවැත්වෙන්නේ ය යි හෝ ඕනෑකමින් ම සහ රෙජිස්ට්‍රාර්ගෙන් දැන්වීමක් ලැබුණු පසුවත් මේ ආඥාපනතෙහි විධිවිධාන කිසිවක් සමිතිය විසින් කඩ කර තිබේ ය යි හෝ නැතහොත් සමිතිය අභාවයට ගොස් ඇත්තේ ය යි තමා සැහීමට පත්වන සේ ඔප්පු වූ විට ඇමතිවරයාගේ අනුමතිය ඇති ව,

රෙජිස්ට්‍රාර් විසින් සිය අත්සනින් යුත් ලියවිල්ලකින් අවලංගු කළ හැකි ය.

**අත්හිටුවීම.**

(2) ඇමතිවරයාගේ අනුමතිය ඇති ව තමාට සමිතියක ලියාපදිංචි කිරීම අවලංගු කළ හැකි කවර අවස්ථාවක වුව ද රෙජිස්ට්‍රාර් විසින් තමාගේ අත්සනින් යුතු ලියවිල්ලකින් තුන් මසක් නො ඉක්මවන ඕනෑ ම කාලයකට ඒ ලියාපදිංචි කිරීම අත්හිටුවිය හැකි ය; එසේ ම ඔහුට ඇමතිවරයාගේ අනුමතිය ඇති ව කලින් කල එබඳු ම කාලයකට ඒ අත්හිටුවීම අළුත් කළ හැකි ය.

**අවලංගු කිරීම සහ අත්හිටුවීම දැන්වීම.**

(3) සමිතියක ලියාපදිංචි කිරීමක් පිළිබඳ, (සමිතියේ ඉල්ලීම පිට හැර) යම් අවලංගු කිරීමක් හෝ අත්හිටුවීමක් කළ හැකි වීමට ප්‍රථම, යෝජිත ඒ අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ හේතු ප්‍රසිද්ධියේ දක්වමින් රෙජිස්ට්‍රාර් විසින් ඒ සමිතියට දෙමසකට නො අඩු කාලයක් කල් දෙමින් ලියවිල්ලකින්

දැනුම්දීමක් කළ යුතු ය. එසේ ම, යම් අවලංගු කිරීමක් හෝ අත්හිටුවීමක් පිළිබඳ දැනුම්දීමක් එය සිදු වූ පසු කළ හැකි තාක් ඉක්මණින් ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය.

අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට විරුද්ධ ව ආයාචනය කිරීම.

(4) රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබීමකට විරුද්ධ ව ආයාචනා කිරීමට මෙහි ලා සලසා ඇත්තා වූ විධිවිධානවල ආකාරයට ම, ලියාපදිංචි කිරීම අවලංගු කිරීමට විරුද්ධ ව හෝ හය මාසයකට පසු අළුත් කරන ලද අත්හිටුවීමකට විරුද්ධ ව සමිතියක් විසින් ආයාචනා කළ හැකි ය.

අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ ප්‍රතිඵලය.

(5) ලියාපදිංචි කිරීම අත්හිටුවනු ලැබූ හෝ අවලංගු කරනු ලැබූ සමිතියක් විසින්, එසේ එය අත්හිටුවනු ලැබූ හෝ අවලංගු කරනු ලැබූ (අත්හිටුවනු ලැබුවේ නම් අත්හිටුවීම පවත්නා තෙක් පමණක් සහ මෙයින් දෙන ලද ආයාචනා කිරීමේ අයිතියට ද යටත් ව ය) අවස්ථාවේ පටන්, ලියාපදිංචි කළ සමිතියකට අයත් වරප්‍රසාද එසේ භුක්ති විඳීම, සම්පූර්ණයෙන් නතර විය යුතු ය. එහෙත් ඒ සමිතිය සැබවින් ම සටන් ව ඇති කිසියම් බැඳීමකට එයින් හානියක් නො විය යුතු අතර එවා, එ බඳු අත්හිටුවීමක් හෝ අවලංගු කිරීමක් සිදු වී නැත් තාක් මෙන් ඒ සමිතියට විරුද්ධ ව ක්‍රියාත්මක කළ හැකි ය.

ව්‍යවස්ථා සහ සංශෝධන.

7. සමිතිවල ව්‍යවස්ථා සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන බලපැවැත්විය යුතු ය:—

ව්‍යවස්ථාවලට අඩංගු විය යුතු විධිවිධාන.

(1) ලියාපදිංචි කරනු පිණිස යවනු ලබන සෑම සමිතියක ම ව්‍යවස්ථාවලට, උපලේඛනයෙහි සඳහන් කර ඇති විවිධ කරුණු පිළිබඳ විධිවිධාන අඩංගු විය යුතු ය.

සංශෝධන ලියාපදිංචි කළ යුතු බව.

(2) ලියාපදිංචි කරන ලද සමිතියකින් කරනු ලබන කිසි ම ව්‍යවස්ථා සංශෝධනයක් මේ ආඥාපනත යටතේ එය ලියාපදිංචි කරන තුරු වලංගු නො විය යුතු අතර, එය ලියාපදිංචි කිරීම සඳහා සාමාජිකයන් තිදෙනකු සහ ලේකම් විසින් අත්සන් කරන ලද එහි පිටපත් රෙජිස්ට්‍රාර් වෙත යැවිය යුතු ය.

සංශෝධනවලට අදාළ විධිවිධාන.

(3) ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමකට විරුද්ධව ආයාචනා කිරීම සම්බන්ධයෙන් මෙයට ඇතුළත් ව ඇති විධිවිධානය ව්‍යවස්ථා සංශෝධන සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

සංශෝධන ලියාපදිංචි කළ බව දැන්වීම.

(4) ව්‍යවස්ථාවක් පිළිබඳ යම් සංශෝධනයක් මේ ආඥාපනතේ විධිවිධානවලට පටහැනි නොවන බවට තමා සෑහීමට පත් වූ විට, එය ලියාපදිංචි කළ බවට ලිපියක් රෙජිස්ට්‍රාර් විසින් සමිතිය වෙත යැවිය යුතු අතර ඒ ලිපිය ඒ සංශෝධනය විධිමත් ලෙස ලියාපදිංචි කළ බවට තීරණාත්මක සාක්ෂිය විය යුතු ය.

ඉල්ලූ විට ව්‍යවස්ථා පිටපතක් දිය යුතු බව

(5) ශත විසි පනකට නො වැඩි මුදලක් ගෙවා ඉල්ලූ විට, එසේ ඉල්ලන සෑම කෙනකුට ම, ලියාපදිංචි කළ සමිතියක ව්‍යවස්ථා පිටපතක් ඒ සමිතිය විසින් සැපයිය යුතු ය.

8. ලියාපදිංචි කළ සමිතිවල යුතුකම් සහ බැඳීම් සම්බන්ධයෙන් පහත දැක්වෙන විධිවිධාන බලපැවැත්විය යුතු ය:— සමිතිවල යුතුකම් හා බැඳීම්.

(1) සෑම සමිතියක් පිළිබඳව—

(අ) සියලු ලියුම්කියුම් සහ දන්වීම් යැවිය හැකි ලියාපදිංචි කළ කායාංශලයක් ඇති විය යුතු අතර ඒ කායාංශලයෙහි පිහිටීම සහ ඒ පිළිබඳ සෑම වෙනසක් රෙජිස්ට්‍රාර් වෙත දන්වා යැවිය යුතු ය; ලියාපදිංචි කළ කායාංශලය.

(ආ) එහි සෑම කායාංශලයක නැතහොත් සමිතියේ වැඩ කටයුතු කරන සෑම තැනක පිට පැත්තේ ප්‍රකට ස්ථානයක පහසුවෙන් කියවිය හැකි අකුරෙන් එහි නම පින්තාරු කළ යුතු ය, නැතහොත් පින්තාරු කොට තැබිය යුතු ය. සවි කළ යුතු ය, නැතහොත් සවි කොට තැබිය යුතු ය. සමිතියේ මුද්‍රාවෙහි ද එහි නම පැහැදිලි අකුරෙන් ඔබ්බවා තිබිය යුතු ය. එසේම, සමිතියේ සියලු දැන්වීම්වල, ප්‍රසිද්ධ දැන්වීම්වල සහ අවශේෂ නිල ප්‍රකාශයන්හි ද, සමිතිය විසින් හෝ ඒ වෙනුවෙන් අත්සන් කර ඇත්තේ යයි හැඟවෙන්නා වූ සියලු විනිමය පත්‍රවල, පොරොන්දු නෝට්ටුවල, ඇප ඔප්පුවල, ගනුදෙනු ලියවිලිවල, චෙක් පත්වල, සහ මුදල් හෝ බඩු සඳහා වූ ඇණවුම්වල ද, එසේ ම සමිතියේ සියලු පාර්සල් බිල්පත්වල, බඩු විස්තර ලේඛනවල, කුවිතාන්සිවල සහ ණයවර ලිපිවල ද පැහැදිලි අකුරෙන් එහි නම සඳහන් කොට තිබිය යුතු ය; නම ප්‍රකාශයට පත් කිරීම.

(ඇ) යටත් පිරිසෙයින් සෑම වර්ෂයකට එක් වරක්, මෙහි සඳහන් අන්දමට පත් කර ගනු ලැබූ ගණන් පරීක්ෂකයකු වෙත, සමිතියේ ගිණුම් ගණන් පරීක්ෂණය පිණිස ඉදිරිපත් කළ යුතු ය. සමිතියේ සියලු පොත් සහ ගිණුම් බැලීමට ඉඩ ලැබිය යුතු ඒ ගණන් පරීක්ෂකයා සමිතියේ අය හා වැය ද මුදල් හා බඩු බාහිරා ද පිළිබඳ සාමාන්‍ය ප්‍රකාශය පරීක්ෂා කොට බලා, ඒ හා සම්බන්ධ ගිණුම් සහ වවුචර සමග සැසැඳීමෙන් එහි හරි වැරදි ද බලා, එය නිවැරදි බව ද යථා පරිදි වවුචරවලින් සනාථ වී තිබෙන බව ද නීතියට එකඟ ව ඇති බව ද තමාට පෙනී ගිය බවට එහි අත්සන් කළ යුතු ය. නො එසේ වී නම්, එය වැරදි බව, වවුචරවලින් සනාථ නොවී පවත්නා බව හෝ නීතියට එකඟව නැති බව තමාට පෙනී යන්නේ කුමන කරුණු අතින් දැයි විශේෂයෙන් සමිතියට වාර්තා කළ යුතු ය; ගණන් පරීක්ෂා කිරීම.

(ඈ) සෑම වර්ෂයකට එක් වරක් ජූනි මාසයේ පළමුවෙනි දිනට ප්‍රථම සමිතියේ විවිධ පරමාර්ථයන් සම්බන්ධ වියදම් වෙන වෙන ම දක්වා තිබිය යුතුවූත් එවකට අන්තිමට ඉකුත් වූ දෙසැම්බර් මාසයේ තිස් එක් වෙනි දින දක්වා සහ ඒ දිනය ද ඇතුළත් වන පරිදි පිළියෙළ කරනු ලැබුවා වූත් මේ ආඥාපනතින් විධි වාර්ෂික වාර්තා.

විධාන සලසා ඇති අයුරු පත් කරනු ලැබූ ප්‍රසිද්ධ ගණන් පරීක්ෂකයකු විසින් ගණන් පරීක්ෂා කිරීම කරන ලද බව සහ ඒ කවුරුන් විසින් ද යන බව සඳහන් කළාවූත්; සමිතියේ අය සහ වැය ද මුදල් සහ බඩු බාහිරා ද පිළිබඳ ගණන් පරීක්ෂිත පරිදි වූ (වාර්තාව යයි කිව යුතු) සාමාන්‍ය ප්‍රකාශයක් රෙජිස්ට්‍රාර් වෙත යැවිය යුතු ය. තවද, ඒ හා සමග ගණන් පරීක්ෂකගේ වාර්තාවේ පිටපතක් ද යැවිය යුතු ය.

එසේ වුව ද ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයෙහි නිවේදනයක් පළ කිරීමෙන්, විශේෂයෙන් බලය පවරනු ලැබූ යම් සමිතියක් සම්බන්ධයෙන්, ඒ සමිතියේ වාර්තාව ඒ නිවේදනයෙහි නියමිත ව සඳහන් කරනු ලැබිය හැකි දින දක්වා පිළියෙළ කළ යුතු ය යි ද එහි ම සඳහන් කරනු ලැබිය හැකි දිනවල දී රෙජිස්ට්‍රාර් වෙත යැවිය යුතු ය යි ද නියෝග කළ හැකි ය.

පොත් පරීක්ෂා කිරීම.

(ඉ) ඕනෑම සාමාජිකයකුට නැතහොත් සමිතියේ අරමුදල් ගැන සැලකිල්ලක් දක්වන ඕනෑම තැනැත්තකුට ලියාපදිංචි කළ සමිති කාර්යාලයෙහි දී හෝ තබා තිබෙන වෙන යම් ස්ථානයක දී සියලු සුදුසු කාල වේලාවල සමිතියේ පොත් හා සාමාජිකයන්ගේ නම් පරීක්ෂා කිරීමට ඉඩ දිය යුතු ය; එහෙත් එසේ කළ යුත්තේ එවැනි පරීක්ෂා කිරීම් කළ යුතු ආකාරයත් වේලාවත් පිළිබඳ ව සමිතියේ මහා සභා රැස්වීම් විසින් කලින් කලට පනවනු ලැබිය හැකි නියෝගවලට යටත් ව ය. එසේකුදු වුවත් සමිතියේ නිලධාරියකු හෝ සමිතියෙන් සම්මත යෝජනාවකින් විශේෂයෙන් බලය පවරනු ලැබූවකු හැර මිස, එබඳු කිසිම සාමාජිකයකුට හෝ තැනැත්තකුට අන් කිසිම සාමාජිකයකුගේ ණයක් හෝ තැන්පත් කිරීමක් ඒ සාමාජිකයාගෙන් ලියවිල්ලකින් ලද කැමැත්ත නොමැති ව පරීක්ෂා කිරීමට අයිතියක් නො තිබිය යුතු ය;

වාර්ෂික වාර්තා පිටපත් සැපයීම.

(ඊ) සෑම සාමාජිකයකුට ම නැතහොත් සමිතියේ අරමුදල් කෙරෙහි සැලකිල්ලක් දක්වන සෑම තැනැත්තකුටම ඉල්ලා සිටි විට තත් කාලය සඳහා වූ සමිතියේ ඉකුත් වාර්ෂික වාර්තාවේ පිටපතක් නොමිලයේ සැපයිය යුතු ය;

ශේෂ පත්‍රය.

(උ) තවද ගණන් පරීක්ෂකගේ වාර්තාව ද සමග තත් කාලය සඳහා වූ ඉකුත් ශේෂ පත්‍රයේ පිටපතක්, ලියාපදිංචි කළ සමිති කාර්යාලයේ ප්‍රකට ස්ථානයක සෑම විට ම එල්ලා තැබිය යුතු ය;

මහා සභා රැස්වීම.

(ඌ) ලියාපදිංචි කරනු ලැබූ සමස්ත කාල සීමාවක් ඇතුළත සමිතියේ සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක් පැවැත්විය යුතු ය. ඉන් පසු, සවත්

පිරිසෙයින් සෑම ලිත් වර්ෂයකට එක් වරක්, සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක් පැවැත්විය යුතු ය.

(2) මේ ආඥපනතේ කාර්යයන් සඳහා නියමිත සෑම වාර්තාවක් සහ අන් හැම ලේඛනයක් රෙජිස්ට්‍රාර් විසින් නියම කරනු ලබන ආකෘතියට අනුව සහ විස්තර ඇතුලත්කොට පිළියෙල කළ යුතු ය.

වාර්තා, නියමිත ආකෘතියෙහි විය යුතු බව.

(3) රෙජිස්ට්‍රාර් තැන වෙත යැවිය යුතු යයි මේ වගන්තියෙන් නියමිත සියලු ලේඛන පිළිවෙළින් ඒවාට සම්බන්ධ සමිති ව්‍යවස්ථා ද සමඟ භාර දිය යුතු අතර රෙජිස්ට්‍රාර් විසින් නියම කරනු ලබන අන්දමට ඒවායේ සඳහන් කළ යුතු යම් නිරීක්ෂණ වෙතොත් ඒවා ද සමඟ රෙජිස්ට්‍රාර් විසින් ඒ ලේඛන ලියාපදිංචි කළ යුතු ය, නැතහොත් සටහන් කර ගත යුතු ය.

ලේඛන සටහන් කර ගැනීම.

9. ලියාපදිංචි කළ සමිති පහත සඳහන් වරප්‍රසාදවලට හිමිකම් ලැබිය යුතු ය:—

සමිතිවල වරප්‍රසාද.

(1) සමිතියක්, එය ලියාපදිංචි කරනු ලැබීමේ හේතුවෙන්, එසේ එය ලියාපදිංචි කරන ලද බවට එවන ලද ලිපියෙහි විස්තර වන නමින්, බලය ලත් සංස්ථාවක් විය යුතු ය; අවිච්ඡින්න පරම්පරාවක් සහ පොදු මුද්‍රාවක් ද සීමිත වගකීමක් ද ඇති ව, එම නමින්, සිවිල් නඩු පැවරිය හැකි ද පවරනු ලැබිය හැකි ද විය යුතු ය; තවද, ඒ හේතුකොටගෙන, සමිතිය වෙනුවෙන් භාරයක් වශයෙන් තාවකාලික ව කිසියම් තැනැත්තකුට පවරනු ලබා තිබුණු සියලු දේපළ සමිතිය වෙත පැවරෙන්නේ ද විය යුතු ය.

සංස්ථාගත කිරීම.

(2) එක් එක් සාමාජිකයා සමිතියේ ව්‍යවස්ථා පිළිගනිමින් එහි අත්සන් කරනු ලැබ, තමා වෙනුවෙන්, තමාගේ උරුමක්කාරයන්, බුදල් බලකරුවන් සහ පරිපාලකයන් වෙනුවෙන් එම ව්‍යවස්ථාවලට එකඟවීමට පොරොන්දුවක් ඒ ව්‍යවස්ථාවලට ඇතුලත් වූයේ නම්, සමිතිය ද සමිතියේ සියලු ම සාමාජිකයන් ද සමිතියේ නැතහොත් සාමාජික-යන්ගේ මාර්ගයෙන් හිමිකම් ඉල්ලන සියලු දෙනා ද සමිතියේ ව්‍යවස්ථාවලින් බැඳෙන්නේ යම් ප්‍රමාණයකට ද, ඒ ප්‍රමාණයට ම ඒ ව්‍යවස්ථාවලින් මේ ආඥපනතේ විධිවිධානවලට යටත් ව ඔවුන් බැඳී සිටිය යුතු ය.

ව්‍යවස්ථාවලින් සාමාජිකයන් බැඳෙන බව.

(3) සාමාජිකයකු විසින් සමිතියට ගෙවිය යුතු සියලු මුදල් ඒ සාමාජිකයාගෙන් සමිතියට ලැබිය යුතු ණයක් විය යුතු අතර, හිමිකම් පා ඉල්ලා සිටින මුදල කොපමණ වුව ද එය එසේ ණයක් වශයෙන් සමිතියේ තෝරා ගැනීම අනුව කොළඹ සුළු විවාද අධිකරණයේ දී හෝ එම සාමාජිකයා පදිංචි ව සිටින කොට්ඨාශයේ සුළු විවාද අධිකරණයේ දී අය කරගත හැකි විය යුතු ය.

සාමාජිකයකු ගෙවිය යුතු මුදල සමිතියට ණයක් බව.

රුපියල් දෙදහස් පන්සියය නො ඉක්මවූ මුදල් ගෙවීම සඳහා නම් කිරීමේ බලය.

(4) වයස අවුරුදු දහසයකට අඩු නො වන්නා වූ සමිතියේ සාමාජිකයකු විසින්, ඔහුගේ නමට සමිතියේ පොත්වල බැර් කර ඇති මුදල රුපියල් දෙදහස් පන්සියය ඉක්මවා නො යේ නම්, සමිතියේ ලියාපදිංචි කළ කාර්යාලයට භාර දෙනු ලබන හෝ යවනු ලබන තම අත්සනින් යුත් ලියවිල්ලකින්, තමාගේ ඇවෑමෙන් සිය අයිතිවාසිකම් ගෙවනු ලැබිය යුතු විමට, නම් කරන්නාගේ ස්වාමි පුරුෂයා, භාර්යාව, පියා, මව්, දරුවා, සහෝදරයා, සහෝදරිය, බෑණා හෝ ලේලි නම් මිස සමිතියේ නිලධාරියකු හෝ සේවකයකු නො වන, යම් තැනැත්තකු නම් කළ හැකි ය. තවද එවැනි නම් කිරීමක්, වෙනත් අයුරකින් නොව එපරිද්දෙන් ම භාරදිය යුතු හෝ යැවිය යුතු තමාගේ අත්සනින් යුත් ලියවිල්ලකින්, ඔහු විසින්, කලින් කල අවලංගු කළ හැකි ය; නැතහොත් වෙනස් කළ හැකි ය. එබඳු හැම සමිතියක් එසේ නම් කරනු ලැබූ සියලු දෙනාගේ නම් විධිමත් ලෙස ඇතුළත් කළ යුතු පොතක් තබා ගත යුතු ය; එවැනි නම් කිරීමකට අයත් වන අයිතිවාසිකම නම් කරනු ලැබූ තැනැත්තාට ගෙවිය හැකි විය යුතු අතර, නම් කරන්නකු ගේ මරණය සතුටුදායක ලෙස ඔප්පු වූ කල්හි ඒ නම් කිරීම යටතේ හිමිකම් ලබා ඇති හැම තැනැත්තකුට ම ඔහුගේ අයිතිවාසිකමෙහි මුළු වටිනාකම සමිතියේ කාරක සභාව විසින් ගෙවිය යුතු ය.

රුපියල් දෙදහස් පන්සියය නොඉක්මවූ මුදල් ගණන් බෙදා දීම.

(5) රුපියල් දෙදහස් පන්සියය නො ඉක්ම වූ යම් අයිතිවාසිකමක් සමිතියෙහි ඇති සමිතියේ යම් සාමාජිකයෙක් අන්තිම කැමති පත්‍රයකින් පැවරුම් නො කොට හා ඔහු මිය යන අවස්ථාවෙහි අවලංගු නොකැරී පැවති, මේ ආඥාපනත යටතේ කළ නම් කිරීමක් ද නොමැති ව මිය ගියේ නම්, ඒ අයිතිවාසිකම, එය නීත්‍යනුකූල ව ලැබීමට හිමිකම් ඇත්තේ ය යි කාරක සභාවේ වැඩි දෙනකුට ඔවුන් සතුටුදායක ය යි සිතන සාක්ෂි පිට පෙනී යන තැනැත්තාට හෝ තැනැත්තන් අතර, පරිපාලන බලපත්‍ර නොමැති ව ම, පැවරිය හැකි හෝ ගෙවිය හැකි විය යුතු ය.

හිමිකම් ඇති සේ පෙනෙන තැනැත්තන්ට ගෙවීම වලංගු බව.

(6) යම් සාමාජිකයකු මිය යාමෙන් පසු, කාරක සභාව විසින්, මේ වගන්තිය යටතේ හිමිකම් ඇත්තේ ය යි එකල පමණක් ව පෙනී ගිය යම් තැනැත්තකුට යම් කිසි ගෙවීමක් කර ඇති විට, වෙන යම් තැනැත්තකු විසින් කාරක සභාවෙන් හෝ සමිතියෙන් කරන කවර ඉල්ලීමක් වුව ද, ඒ ගෙවීම නැතහොත් පැවරීම වලංගු ව බලපැවැත්විය යුතු ය.

භාරකරුවන් නොමැති විට දේපළ පවරන මෙන් රෙජිස්ට්‍රාර් විසින් නියෝග කළ හැකි බව.

(7) එවැනි යම්කිසි සමිතියකට අයිති යම් දේපළක් ඒ සමිතිය වෙනුවෙන් භාරකරු හැටියට තාවත් තැනැත්තකු නැතහොත් තැනැත්තන් සමඟ හවුලේ හෝ තනිකර ම සිය නමින් පවත්නා යම් තැනැත්තෙක් ලංකාවෙන් බැහැර සිටි විට හෝ වස්තු භංගත්වයට පත් වූ විට, හෝ තමාගේ ණය හිමියන් සමඟ ණය සමථයකට එළඹීම පිණිස නැතහොත් පැවරීමෙන් හෝ පිළියෙල කර ගැනීමෙන් තම කටයුතු ඇවර කිරීම පිණිස යම් පෙත්සමක් ඉදිරිපත් කළ

විට හෝ යම් ඔප්පුවක් ලියවා අත්සන් කළ විට නැතහොත් විකල් වූ සිහිය ඇත්තෙක් වූ විට හෝ මිය ගිය විට හෝ භාරකාර තනතුරෙන් ඉවත් කරනු ලැබූ විට හෝ ඒ තැනැත්තා මිය ගොස් ද ජීවත් ව සිටියි ද යන්න දැන ගැනීමට නො හැකි වූ විට සමිතියේ ලේකම් සහ සාමාජිකයන් තුන් දෙනකු විසින් ලියවිල්ලකින් ඉල්ලීමක් කළ පසු සහ තමා සෑහීමට පත්වන පරිදි සාක්ෂි ඔප්පු කිරීමෙන් පසු ඒ දේපළ සමිතිය වෙනුවෙන් වූ භාරකරුවන් වශයෙන් වෙන තැනැත්තන්ගේ නම්වලට පවරන මෙන් රෙජිස්ට්‍රාර් විසින් නියම කළ හැකි ය. තවද, එවැනි කවර පැවරීමක් වුව ද ඉතිරි ව සිටින හෝ යෙදී සිටින භාරකරුවන් විසින් කළ යුතු අතර එවැනි භාරකරුවන් නො සිටියහොත් හෝ එවැනි භාරකරුවන් එවැනි පැවරීමක් කිරීම ප්‍රතික්ෂේප කළහොත් හෝ එසේ කිරීමට අපොහොසත් වුවහොත් එවිට රෙජිස්ට්‍රාර් විසින් ඒ පැවරීම කළ යුතු ය. මේ විධිවිධානය ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා කරනු ලබන කවර දෙයක් සඳහා වුව ද, එය හානිකර ව බලපවත්නා යම් තැනැත්තකුගේ යම් හිමිකම් පෑමක් හෝ ඉල්ලීමක් සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්ට මෙයින් ආරක්ෂාව සලසනු ලැබේ.

(8) ව්‍යවස්ථාවන්හි විරුද්ධ ව විධිවිධාන සලසා නැතහොත් වයසින් අවුරුදු විසි එකට අඩු එහෙත් අවුරුදු දහසයට වැඩි තැනැත්තකුට සමිතියක සාමාජිකයකු විය හැකි ය. එසේ ම ඔහුට, සමිතියේ ව්‍යවස්ථාවලට යටත් ව, සාමාජිකයකු සතු අයිතිවාසිකම් සියල්ලක් (මෙහි විධිවිධාන සලසා තිබෙන අයුරු හැර) භුක්ති විඳීමට ද නීත්‍යානුකූල ලේඛන ලියා අත්සන් කිරීමට හා ව්‍යවස්ථා යටතේ ක්‍රියාවෙහි යෙදිය යුතු හෝ දිය යුතු සියලු නිදහස් කිරීම් දීමට ද හැකි ය. එතකුදු වුවත් ඔහු සමිතියේ කාරක සභිකයකු හෝ භාරකරු, කළමනාකරු හෝ භාණ්ඩාගාරික නො විය යුතු ය.

අඩු වයස්කරුවන්ගේ සාමාජිකත්වය.

(9) යම් පොරොන්දු නෝට්ටුවක් හෝ විනිමය පත්‍රයක් යම් සමිතියක බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකු ලවා එම සමිතිය නමින් හෝ, එය විසින් හෝ වෙනුවෙන් හෝ උදෙසා සකස්කොට හෝ පිළිගෙන හෝ පිටසන් කොට ඇත්තේ නම් එය ඒ සමිතිය වෙනුවෙන් සකස් කරනු ලැබ, පිළිගනු ලැබ හෝ පිටසන් කරනු ලැබ තිබේ යයි සැලකිය යුතු ය.

පොරොන්දු නෝට්ටු සහ විනිමය.

(10) යම්කිසි සමිතියක් විසින් තබනු ලබන යම් සාමාජික නාම ලේඛනයක් හෝ නාමාවලියක් වේ ද එය එහි ඇතුළත් කොට ඇති පහත සඳහන් කවර විස්තරයක් පිළිබඳ ව වුවත් මුල් බැල්මට ම පිළිගත හැකි සාක්ෂි විය යුතු ය:—

(අ) සාමාජිකයන්ගේ නම්, ලිපිනයන් සහ රක්ෂාවල්;

(ආ) සාමාජිකයකු වශයෙන් යම් තැනැත්තකුගේ, සමාගමක හෝ සමිතියක නම ඒ නාම ලේඛනයට හෝ නාමාවලියට ඇතුළත් කළ දිනය;

(ඇ) එවැනි යම් තැනැත්තකු, සමාගමක් හෝ සමිතියක් සාමාජිකත්වයෙන් ඇරුණු දිනය.

සාමාජික නාම ලේඛනය.

ගිවිසුම් කර ගන්නා ආකාරය.

(11) සමිතිය වෙනුවෙන් පහත සඳහන් අන්දමට ගිවිසුම් කර ගත හැකි ය, වෙනස් කළ හැකි ය, නැතහොත් නිදහස් කළ හැකි ය :—

(අ) නොතාරිස් කෙනකු විසින් ලියා සහතික කිරීම අවශ්‍ය යම් ගිවිසුමක් ද සෑම පරකාරිසාධක බලපත්‍රයක් ද සමිතිය වෙනුවෙන් සමිතියේ පොදු මුද්‍රාව යටතේ ලියවිල්ලකින් කළ යුතු ය. එපරිද්දෙන් ම වෙනස් කළ හැකි ය, නැතහොත් නිදහස් කළ හැකි ය;

(ආ) ලියවිල්ලකින් කිරීමටත් එයින් බැඳෙන තැනැත්තා විසින් අත්සන් කිරීමටත් නියමිත කවර ගිවිසුමක් වුව ද සමිතියෙන් ලද ප්‍රකාශිත හෝ වටහාගත හැකි බලය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් සමිතිය වෙනුවෙන් ලියවිල්ලකින් කළ හැකි ය. එපරිද්දෙන් ම වෙනස් කළ හැකි ය, නැතහොත් නිදහස් කළ හැකි ය;

(ඇ) වාචික ප්‍රකාශයෙන් කළ කල්හි සිරිත් වශයෙන් පුද්ගලයන් කෙරෙහි බැඳීම් ඇති කරවන කවර ගිවිසුමක් වුව ද සමිතියෙන් ලද ප්‍රකාශිත හෝ වටහාගත හැකි බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් සමිතිය වෙනුවෙන් වාචික ප්‍රකාශයෙන් කළ හැකි ය. එපරිද්දෙන් ම වෙනස් කළ හැකි ය, නැතහොත් නිදහස් කළ හැකි ය;

(ඈ) සමිතිය විසින් හෝ වෙනුවෙන් යම් ගිවිසුමක් කර ගත් බව, වෙනස් කළ බව හෝ නිදහස් කළ බව හඟවන ලියවිල්ලකට සමිතියේ යම් නිලයක් දරන්නෙකු යි හැඟවෙන තැනැත්තා විසින් තබන ලද අත්සනක් ඒ අත්සන තබන වේලෙහි එකියන ලද නිලය දරමින් සිටි තැනැත්තකුගේ අත්සන වශයෙන් මුල් බැල්මට ම පිළිගත යුතු ය.

තවද, මෙහි අන්තර්ගත විධිවිධාන අනුව කර ගනු ලැබිය හැකි හෝ කර ගෙන ඇත්තා වූ හෝ වෙනස් කරනු ලැබිය හැකි හෝ වෙනස් කොට ඇත්තා වූ හෝ නිදහස් කරනු ලැබිය හැකි හෝ නිදහස් කොට ඇත්තා වූ සියලු ම ගිවිසුම් ඒවායෙහි ආකාරය සම්බන්ධයෙන් වූ තාක් දුරට නීතියෙහි ලා බලපැවැත්විය යුතු අතර, ඒ ගිවිසුම් වලින් සමිතිය ද, ගිවිසුමට අයත් සෙසු සියලු ම පාර්ශ්වයන් ද උචිත පරිදි ඔවුන්ගේ උරුමක්කාරයින්, මුදල් බලකරුවන් හෝ පරිපාලකයන් ද බැඳිය යුතු ය.

සමිතිවල දේපල සහ අරමුදල්.

10. ලියාපදිංචි කළ සමිතිවල දේපල සහ අරමුදල් සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන බලපැවැත්විය යුතු ය :—

(1) ව්‍යවස්ථා මගින් අන් අන්දමකට නියම වී නැතහොත් සමිතියක් විසින් සමිතියේ සිය නාමින් යම් ඉඩමක් අයිති ව සිටීම, මිලයට ගැනීම හෝ බද්දට ගැනීම ද එ සේ ම විකිණීම, හුවමාරු කිරීම, උකස් කිරීම, බදු දීම හෝ (ගොඩනැගිලි වෙනස් කිරීමේ, කඩා බිඳ දැමීමේ හා නැවත

171

ඉදි කිරීමේ බලය ඇත් ම) එහි ගොඩනැගිලි ඉදි කිරීම ද කළ හැකි ය. එනමුදු එබඳු විකිණීමක්, හුවමාරුවක්, උකස් කිරීමක් හෝ බදු දීමක් කිරීමට සමිතියට ඇති බලය ගැන විමසීමට කිසි ම ගැනුම්කරුවකු, පැවරුම්ලාභියකු, උකස් හිමියකු හෝ බද්දට සිටින්නකු බැඳී නො සිටිය යුතු ය. තවද, එවැනි විකිණීමකින්, හුවමාරුවකින්, උකස් කිරීමකින් හෝ බද්දකින් නැතහොත් ඒ හා සම්බන්ධයෙන් ලැබෙන සියලු මුදල් ගෙවූ බවට සමිතියේ කුවිතාන්සිය නිදහස් කිරීමක් විය යුතු ය.

**සාමාජිකයින්ට අත්තිකාරම්.**

(2) චංචල හෝ නිශ්චල දේපළ ඇපයට ඇති ව සමිතිය විසින් සාමාජිකයන්ට අත්තිකාරම් දීම සඳහා ව්‍යවස්ථාවලින් විධිවිධාන සැලසිය හැකි ය.

**ආකෘති.**

(3) හිමිකරයක, ආපසු භාරදීමක, ඇතුළත් කර ගැනීමක, උකසක, පැවරීමක, ගිවිසුමක, බැඳුම්කරයක හා සමිතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනත් නීත්‍යනුකූල ලේඛනයක ආකෘතීන් ව්‍යවස්ථාවල හෝ ඊට යා කොට ඇති යම් උපලේඛනයක, දක්වා තිබිය හැකි ය.

**සමිතියේ ලාභ යෙදීම.**

(4) සමිතියේ ලාභ නීත්‍යනුකූල කවර දෙයක් සඳහා වුව ද යෙදිය හැකි ය.

**පිටසන් කළ කුවිතාන්සියෙන් උකස නිදහස් වීම.**

(5) යම්කිසි උකසකින් හෝ වෙනත් සහතිකයකින් සමිතියට ලැබිය යුතු සියලු මුදල් සඳහා උපලේඛනයට ඇතුළත් ආකෘතිය අනුව හෝ සමිතියේ ව්‍යවස්ථාවලින් නැතහොත් ඒ ව්‍යවස්ථාවලට යා කොට ඇති උපලේඛනයක නියමිත ආකෘතිය අනුව වූ ද, සමිතියේ කාරක සභිකයන් දෙදෙනකු විසින් අත්සන් කොට ලේකම් විසින් අනු අත්සන් කරන ලද්දා වූ ද, ඒ උකසෙහි නැතහොත් සහතිකයෙහි පිටසන් කරන ලද්දා වූ ද කුවිතාන්සියකින් ඒ උකස හෝ වෙනත් සහතිකය අවලංගු විය යුතු ය.

**ආයෝජනය.**

(6) සමිතියේ ව්‍යවස්ථාවලින් ඉඩ ලැබේ නම් සමිතියේ අරමුදල් වලින් එහි කාර්යයන් සඳහා වහා අවශ්‍ය නො වන යම්කිසි කොටසක් සින්නක්කර නැතහොත් බදු ඉඩම් පිළිබඳ සුරැකුම්පත්වල හෝ මේ ආඥාපනත යටතේ ලියාපදිංචි කළ අන් සමිතියක නැතහොත් සමාගම් ආඥාපනත යටතේ ලියාපදිංචි කළ වගකීම් සීමාසහිත යම් සමාගමක කොටස්වල හෝ සුරැකුම්පත්වල හෝ පොදු අරමුදල්වල, රජයේ ස්කන්ධවල නැතහොත් මහා බ්‍රිතාන්‍යයේ, ඉන්දියාවේ, බුරුමයේ හෝ ලංකාවේ සුරැකුම්පත්වල ආයෝජනය කළ හැකි ය ; එ සේ ආයෝජනය කරන සමිතියක් විසින් ලියාපදිංචි කළ සිය නමින් එය කළ හැකි අතර ඒ සමිතිය සමාගම් ආඥාපනතේ අර්ථානුකූල ව පුද්ගලයකු වශයෙන් සැලකිය යුතු ය.

මුදල් ලබන හෝ භාර ව සිටින නිලධාරීහු.

11. ලියාපදිංචි කළ සමිතිවල, මුදල් ලබන හෝ භාර ව සිටිනා නිලධාරීන් සම්බන්ධයෙන්, පහත සඳහන් විධිවිධාන බලපැවැත්විය යුතු ය:—

(1) සමිතියේ ව්‍යවස්ථාවලින් නියම ව ඇතොත්, සෑම නිලධාරියකු ම ස්වකීය පදවියේ වැඩ භාර ගැනීමට ප්‍රථම, සමිතියේ ව්‍යවස්ථාවලින් නියම කොට ඇති නැතහොත් සමිතිය හෝ එහි කාරක සභාව තමාට නියම කරන කාල වේලාවන් හි දී සමිතිය වෙනුවෙන් තමා විසින් භාර ගනු ලබන හෝ ගෙවනු ලබන සියලු ම මුදල් පිළිබඳ සත්‍ය සහ සාධාරණ ගණන් පෙන්වීමක් කරන බවටත් සමිතියට තමාගෙන් අය විය යුතු සියලු මුදල් ගෙවන බවටත් ප්‍රකාන්දෙයි සොද, කාරක සභාව නියම කරන පරිදි ඇපකරුවකු ඇති ව හෝ නැති ව, උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතිය අනු ව වූ හෝ සමිතියේ කාරක සභාව අනුමත කරන අන් ආකෘතියක් අනු ව වූ බැඳුම්කරයකින් බැඳිය යුතු ය; නැතහොත් කාරක සභාව නියම කරන මුදලකට ඇපකාර සමිතියක ඇපයක් තැබිය යුතු ය.

නිලධාරීන්ගේ ගිණුම.

(2) සෑම නිලධාරියකු හෝ ඔහුගේ මුදල් බලකරුවකු හෝ පරිපාලකයකු සමිතියේ ව්‍යවස්ථා අනු ව තමා ගණන් පෙන්විය යුතු කාල වේලාවල දී හෝ එසේ කරන මෙන් ඉල්ලූ විට හෝ තමා අන්තිමට පදිංචි ව සිටි නැතහොත් සිරිත් පරිදි පදිංචි ව සිටින ස්ථානයේ දී දුන් හෝ තබා ආ ලිපියකින් දැනුම් දුන් විට, සමිතිය විසින් හෝ එහි කාරක සභාව විසින් පරීක්ෂා කර බලා ඉඩ දීම හෝ නො දීම සඳහා, ඔවුන් විසින් නියම කරනු ලැබිය හැකි පරිදි, සිය ගිණුම ඉදිරිපත් කළ යුතු ය. තවද, එබඳු ඉල්ලීමක් හෝ දැනුම් දීමක් කළ විට තත් කාලයෙහි තමන් අත හෝ භාරයෙහි පවත්නා සියලු මුදල් සමිතිය හෝ කාරක සභාව විසින් පත් කරනු ලබන තැනැත්තකුට ගෙවිය යුතු ය; එසේ ම, එසේ ඇති සියලු දේපළ ද ඒ තැනැත්තාට භාර දිය යුතු ය. ඉහත කී අන්දමට ඒ ගිණුම භාරදීම හෝ ඒ මුදල් ගෙවීම හෝ ඒ දේපළ භාර දීම පිළිබඳ යම් පැහැර හැරීමක් හෝ ප්‍රතික්ෂේප කිරීමක් කරන ලද කවර අවස්ථාවක දී වුවත් ඉහත සඳහන් කළ බැඳුම්කරය හෝ ඇපය පිට සමිතිය විසින් නඩු පැවරිය හැකි ය.

නීති කෘත්‍ය.

12. ලියාපදිංචි කළ සමිතිවලට විරුද්ධ නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන බලපැවැත්විය යුතු ය:—

සමිතියකට හෝ සමිතියකට විරුද්ධ ව නිකුත් කරනු ලබන සිතාසියක්, ආඥාපත්‍රයක්, නැඩවීමේ නියෝගයක හෝ නීති කෘත්‍ය බද්ධ වෙනත් ලේඛනයක සැබෑ පිටපතක් සමිතියේ ලියාපදිංචි කළ කාර්යාලය වෙත හෝ එම නීති කෘත්‍යය ඉදිරිපත් වී ඇති අධිකරණයේ අධිකරණ සීමාව තුළ පිහිටි සමිතියේ යම් ව්‍යාපාර ස්ථානයක් වෙත තබා ඒමෙන් නැතහොත් ඒ කාර්යාලය හෝ ව්‍යාපාර ස්ථානය වසා ඇතොත් ඒ පිටපත එහි පිට දොර මත ඇලවීමෙන්

ඒ සිතාසිය, ආඥාපත්‍රය, කැඳවීමේ නියෝගය හෝ නීති කෘත්‍ය බද්ධ වෙනත් ලේඛනය සැපයෙන පරිදි භාර දුන් නා විය යුතු ය; එසේ වුව ද එකී සිතාසියේ, ආඥාපත්‍රයේ, කැඳවීම් නියෝගයේ හෝ නීති කෘත්‍ය බද්ධ වෙනත් ලේඛනයේ සැබෑ පිටපතක් සමිතියේ ලියාපදිංචි කළ කාර්යාලය වෙත තබා ඒමෙන් ඒ භාර දීම කරනු නො ලබන සියලු ම අවස්ථාවල එහි පිටපතක් කළමනාකාර කාරක සභාවට නම් කොට සමිතියේ ලියාපදිංචි කළ කාර්යාලය වෙත යැවිය යුතු ය. තවද ඒ සිතාසිය, ආඥා-පත්‍රය, කැඳවීම් නියෝගය හෝ නීති කෘත්‍ය බද්ධ වෙනත් ලේඛනය සම්බන්ධයෙන් අන් කිසිදු වැඩි දුර පියවරක් ගැනීමට පෙර පිළිසයින් සදිනකට ප්‍රථම, එය ම ලියා-පදිංචි කළ ලිපියක බහා තැපැල් කළ යුතු ය.

13. ලියාපදිංචි කළ සමිති පිළිබඳ ආරාවුල් සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන බලපැවැත්විය යුතු ය :— ආරාවුල්.

(1) සාමාජිකයකු හෝ සාමාජිකයකුගේ මාර්ගයෙන් නැතහොත් ලියාපදිංචි කළ සමිතියක ව්‍යවස්ථා යටතේ හිමිකම් ඉල්ලා සිටින තැනැත්තකු හා සමිතිය හෝ එහි නිලධාරි-යකු සහ අතර ඇතිවන සෑම ආරාවුලක්, ආරාවුල් පිළිබඳ යම් විධානයක් සමිතියේ ව්‍යවස්ථාවලට අඩංගු ව ඇතොත් ඒ ව්‍යවස්ථාවලින් නියම වී ඇති ආකාරයට තීරණය කළ යුතු අතර එසේ කරනු ලබන්නා වූ තීරණයෙන්, ආයාචනයක් නොමැති ව ම, සියලු පාර්ශ්ව-යන් බැඳිය යුතු ය. තවද, ඒ තීරණය ඔවුන් විෂයෙහි අවසාන තීරණය ද විය යුතු ය, එය යම් කිසි අධිකරණයකට ගෙන යා හැකි හෝ ඉන්ජන්ෂන් තහනමකින් තහනම් කළ හැකි නො විය යුතු ය. තීරණය ක්‍රියාවෙහි යෙදවීම පිණිස වූ ඉල්ලීමක් ප්‍රදේශ අධිකරණයට ඉදිරිපත් කළ හැකි ය.

(2) සමිතියක් ආරාවුලක පාර්ශ්වකරුවන් විසින්, තමන්ගේ කැමැත්තෙන් (සමිතියේ ව්‍යවස්ථාවලින් එය ප්‍රකාශිත ව ම තහනම් කොට නැතහොත්) සිය ආරාවුල රෙජිස්ට්‍රාර් වෙත යොමු කළ හැකි ය; රෙජිස්ට්‍රාර් විසින් ආරාවුල විභාග කොට තීරණය කළ යුතු අතර එය තීරණය කිරීමේ වියදම් සමිතියේ අරමුදලින් හෝ එය ගෙවීමට සුදුස්සන් ය යි තමා සලකන ආරාවුලේ පාර්ශ්වකරුවන් විසින් ගෙවන මෙන් නියෝග කිරීමට ඔහුට බලය තිබිය යුතු ය. එසේ ම ඒ තීරණය සහ නියෝග සමිතියේ ව්‍යවස්ථා මගින් නියම වූ ක්‍රමය අනු ව කරන ලද තීරණයක් මෙන් බලපෑ යුතු ය, එපරිද්දෙන් ම ක්‍රියාත්මක කළ හැකි ද විය යුතු ය.

රෙජිස්ට්‍රාර් වෙත යොමු කළ හැකි බව.

(3) රෙජිස්ට්‍රාර් විසින් දිවුරවීම් කළ හැකි ය. එසේ ම, සම්බන්ධිත සියලු පාර්ශ්වයන්ට සහ සාක්ෂිකරුවන්ට පැමිණ සිටින මෙනුත් ප්‍රශ්නයට භාජන වී පවත්නා කරුණට අදාළ සියලු පොත් සහ ලේඛන ඉදිරිපත් කරන මෙනුත් නියම කළ හැකි ය. එපරිද්දෙන් පැමිණ පෙනී සිටීම හෝ ලේඛන

රෙජිස්ට්‍රාර් විසින් දිවුරවීම කිරීම ආදිය කළ හැකි බව.

කිසිවක් ඉදිරිපත් කිරීම හෝ රෙජිස්ට්‍රාර් ඉදිරියේ සාක්ෂි දීම ප්‍රතික්ෂේප කරන කවර තැනැත්තකු වුව ද මේ ආඥා පනත යටතේ වරදකට වරදකරුවකු විය යුතු ය.

ප්‍රදේශ අධිකරණයට ඉල්ලුම් කිරීම ආදිය.

(4) සමිතියක ව්‍යවස්ථාවලට ආරාවුල් පිළිබඳ විධිවිධාන ඇතුළත් ව නැති විට, නැතහොත් සමිතියේ ව්‍යවස්ථා යටතේ යොමු කිරීමක් අදහා සමිතියෙන් ඉල්ලීමක් කොට සතළිස් දිනක් ඇතුළත ආරාවුලක් පිළිබඳ තීරණයක් දී නැති විට, අනාථ සාමාජිකයා හෝ තැනැත්තා විසින් ප්‍රදේශ අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි ය. ප්‍රදේශ අධිකරණය විසින් ආරාවුලේ කරුණු විභාග කොට තීරණය කළ හැකි ය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ උපදෙස් විමසුම් නඩුව.

(5) අධිකරණය හෝ රෙජිස්ට්‍රාර් විසින්, දෙපාර්ශ්වයෙන් කවර පාර්ශ්වයක වුවත් ඉල්ලීම පිට, යම් නීති ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය දැන ගැනීම පිණිස උපදෙස් විමසිය හැකි ය. තවද එසේ ම ප්‍රදේශ අධිකරණයක් විසින් අවසර දිය හැකි අන් දමේ ලේඛන හෝ වෙනත් කරුණු පිළිබඳ එළිදරව් කිරීමක් සම්බන්ධයෙන් හෝ ලේඛන පිළිබඳ එවැනි ම පරීක්ෂාවක් කිරීම සම්බන්ධයෙන් දෙපාර්ශ්වයෙන් කවර පාර්ශ්වයකට වුව ද අධිකරණය හෝ රෙජිස්ට්‍රාර් විසින් අවසර දිය හැකි ය. තවද අධිකරණය හෝ රෙජිස්ට්‍රාර් විසින් තීරණය කරනු ලැබිය හැකි සමිතියේ නිලධාරියකු විසින් සමිතිය වෙනුවෙන් ඒ එළිදරව් කිරීම කළ යුතු ය.

රෙජිස්ට්‍රාර්ගේ පරීක්ෂණ බලතල.

14. ලියාපදිංචි කළ සමිතිවල කටයුතු පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන බලපැවැත්විය යුතු ය:—

(1) ලියාපදිංචි කළ සමිතියක සාමාජික සංඛ්‍යාවෙන් පහෙන් එක් කොටසක් විසින් හෝ සාමාජිකයන් පන්සිය දෙනකුට වැඩි ගණනක් සිටින සමිතියක් වූ කල්හි සාමාජිකයන් සිය දෙනකු විසින් හෝ ඉල්ලා සිටින අවස්ථාවක දී රෙජිස්ට්‍රාර් විසින් ඇමතිවරයාගේ අනුමතිය ඇති ව—

(අ) ඒ සමිතියේ කටයුතු පරීක්ෂා කර බලා ඒ පිළිබඳ වාර්තා කිරීමට පරීක්ෂකයන් එක් කෙනකු හෝ වැඩි දෙනකු පත් කළ හැකි ය. ඒ පරීක්ෂකයන් විසින්, සමිතියේ සියලු ම හෝ යම් ගිණුම් පොත් හා ලේඛන ඉදිරිපත් කරන මෙන් නියම කළ හැකි ය: දිවුරුම් පිට හෝ සහතික ප්‍රකාශ පිට සමිතියේ ව්‍යාපාර සම්බන්ධයෙන් එහි නිලධාරීන්, සාමාජිකයන්, නියෝජිතයන් සහ සේවකයන් ගෙන් විභාග කළ හැකි ය; එසේ ම, එවැනි දිවුරුම් හෝ සහතික ප්‍රකාශ එසේ කරවිය හැකි ය.

විශේෂ රැස්වීම්.

(ආ) රෙජිස්ට්‍රාර් නියම කරන ආකාරයකින් හා නියම කරන වේලාවක හා ස්ථානයක සමිතියේ විශේෂ රැස්වීමක් කැඳවිය හැකි ය. ඒ රැස්වීමේ දී සාකච්ඡා කොට තීරණය කර ගත යුත්තේ කුමන කරුණු දැයි නියම කළ හැකි ය. තවද, සමිතියේ ව්‍යවස්ථාවලට අනු ව කැඳවන ලද රැස්වීමක සියලු බලතල දැරිය යුතු ඒ රැස්වීමට, සියලු ම අවස්ථාවල, සමිති

ව්‍යවස්ථාවල ඊට පටහැනි කුමක් සඳහන් ව ඇත ද, රැස්වීමේ සභාපති පත් කිරීමේ බලය ද තිබිය යුතු ය.

ඉල්ලුම, සාක්ෂිවලින් සනාථ විය යුතු බව.

(2) එවැනි පරීක්ෂණයක් කිරීම හෝ රැස්වීමක් කැඳවීම ඕනෑ වීමට ඉල්ලුම්කරුවන්ට හොඳ හේතු ඇති බවත් ඔවුන් සිය ඉල්ලීම කිරීමේ දී ද්වේෂ සහගත චේතනාවන්ගෙන් පෙළඹී නොමැති බවත් දැක්වීම සඳහා මෙහි සඳහන් කරන ලද්දා වූ ඉල්ලීම, සාක්ෂිවලින් සනාථ වී තිබිය යුතු ය. තවද, රෙජිස්ට්‍රාර් විසින් නියම කරනු ලබන පරිදි ඒ පිළිබඳ දැනුම් දීමක් ද සමිතිය වෙත කළ යුතු ය.

වියදම් වෙනුවෙන් ඇපය.

(3) යම් පරීක්ෂකයකු පත් කිරීමට හෝ රැස්වීම කැඳවීමට පෙර, යෝජිත ඒ පරීක්ෂණයේ හෝ රැස්වීමේ වියදම් සඳහා, සුදුසු ය යි තමා සිතන්නේ නම්, ඉල්ලුම්කරුවන් විසින් ඇපයක් තැබිය යුතු ය යි රෙජිස්ට්‍රාර් විසින් නියම කළ හැකි ය.

වියදම්.

(4) එවැනි කවර පරීක්ෂණයක හෝ රැස්වීමක සහ එයට ආනුෂංගික සියලු වියදම් රෙජිස්ට්‍රාර් නියම කරන පරිදි එය ඉල්ලූ කළ සාමාජිකයන් විසින් හෝ සමිතියේ අරමුදලින් දැරිය යුතු ය.

විශේෂ යෝජනා සහ නීති කෘත්‍ය.

15. ලියාපදිංචි කළ සමිතිවලින් සම්මත කර ගනු ලබන විශේෂ යෝජනා හා ඒ බලය කාරණ කොට ගෙන කෙරෙන්නා වූ නීති කෘත්‍ය සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන බලපැවැත්විය යුතු ය :—

සම්මත විශේෂ යෝජනා.

(1) විශේෂ යෝජනාවක් යනු, එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීමේ අදහස සඳහන් කරමින් ව්‍යවස්ථා අනු ව යථා පරිදි දැන්වීමක් කරනු ලැබූ යම් මහා සභා රැස්වීමක දී තත්කාලයෙහි පෞද්ගලික ව හෝ (පෙරකලාසියෙන් ඡන්දය දීමට ව්‍යවස්ථාවලින් ඉඩ ඇතොත්) පෙරකලාසියෙන් ඡන්දය දීමට ව්‍යවස්ථා යටතේ හිමිකම් ලබා සිටින්නා වූ ද එම රැස්වීමට පැමිණ සිටිය හැකි වූ ද සමිතියේ සාමාජිකයන්ගෙන් හතරෙන් තුන් කොටසකට නො අඩු වැඩි ගණනකින් සම්මත වූත් එසේ ම යථා පරිදි දැනුම් දී, පළමු වරට ඒ යෝජනාව සම්මත කර ගත් දිනයෙන් දින දහ හතරකට නො අඩු මෙන් ම එක් මසකට වැඩි කාලයක දී පවත්වන ලද ඊ ළඟ රැස්වීමක දී තත් කාලයෙහි පෞද්ගලික ව හෝ පෙරකලාසියෙන් හෝ ඡන්දය දීමට හිමිකම් ලබා සිටින්නා වූ ද රැස්වීමට පැමිණ සිටිය හැකි වූ ද ඒ සාමාජිකයන්ගේ වැඩි ගණනකින් ස්ථිර වූත් යෝජනාවකි. මේ වගන්තියෙහි සඳහන් කිසියම් රැස්වීමක දී යෝජනාව සම්මත කර ගන්නා ලද බවට සභාපති විසින් කරනු ලබන ප්‍රකාශයක්, ඒ සිද්ධිය පිළිබඳ තීරණාත්මක සාක්ෂිය වශයෙන් සැලකිය යුතු ය.

නම වෙනස් කිරීම.

(2) විශේෂ යෝජනාවක් සම්මත කර ගැනීමෙන් සහ රෙජිස්ට්‍රාර්ගේ ලිඛිත අනුමතිය ද ඇති ව සමිතියක් විසින් සිය නම වෙනස් කර ගත හැකි ය. එහෙත් එබඳු කිසි ම වෙනසක් සමිතියේ හෝ එහි කිසියම් සාමාජිකයකුගේ කිසිදු අයිති-

වාසිකමක් හෝ යුතුකමක් කෙරෙහි බල නො පෑ යුතු අතර, සමිතිය විසින් පැවැත්වෙන්නා වූ හෝ සමිතියට විරුද්ධ ව පවත්නා වූ කවර නීති කෘත්‍යයක් වුව ද අළුත් නම නො සලකා නො කඩව පවත්වා ගෙන යා හැකි ය.

සමිති ඒකාබද්ධ කිරීම.

(3) කිසියම් සමිති දෙකකට හෝ වැඩි ගණනකට ඒ සමිති දෙකෙහි නැතහොත් සියල්ලෙහි විශේෂ යෝජනාවකින්, එසේ ම ඒ සමිතිවල හෝ සමිති දෙකෙන් කවර එකක හෝ අරමුදල් පිළිබඳ යම් විසුරුවා හැරීමක් හෝ බෙදීමක් කොට හෝ නො කොට එක ම සමිතියක් වශයෙන් ඒකාබද්ධ විය හැකි ය. තවද, කවර සමිතියකට වුවත් ඒ සමිතියෙන් සම්මත විශේෂ යෝජනාවකින් තමන්ගේ බැදීම් ඒ බැදීම් ඉෂ්ට කිරීමට භාර ගන්නා ලියාපදිංචි කළ වෙන යම් සමිතියකට පැවරිය හැකි ය.

සමිති, සමාගම්වලට පරිවර්තනය කිරීම.

(4) සමිතියක් විසින් විශේෂ යෝජනාවකින් සමාගම් ආඥාපනත යටතේ සමාගමකට පරිවර්තනය වීමට හෝ එවැනි කිසියම් සමාගමක් සමග ඒකාබද්ධ වීමට හෝ සිය බැදීම් එයට මාරු කිරීමට තීරණය කර ගත හැකිය.

ණය හිමියාගේ අයිතිවාසිකම.

(5) කිසිම ඒකාබද්ධ වීමකින් හෝ බැදීම් පැවරීමකින් ඊට පාර්ශ්වකරුවන් වූ සමිති දෙකෙන් කවර සමිතියක හෝ කිසි ම සමිතියක ණය හිමියකුගේ කිසියම් අයිතිවාසිකමකට හානියක් නො විය යුතුය.

සම්මත විශේෂ යෝජනාවක් ලියාපදිංචි කිරීම.

(6) මේ වගන්තියෙහි සඳහන් කරන ලද කවර කාර්යයක් සඳහා වුව ද සම්මත කර ගනු ලැබූ සෑම විශේෂ යෝජනාවක ම පිටපතක් රැස්වීමේ සභාපති විසින් අත්සන් කොට, ලේකම් විසින් අනුඅත්සන් කොට, ලියාපදිංචි කරනු පිණිස රෙජිස්ට්‍රාර් වෙත යැවිය යුතු අතර, ඒ පිටපත ලියාපදිංචි කරන තුරු සම්මත ඒ විශේෂ යෝජනාව වලංගු නො විය යුතුය.

සමාගමක් සේ ලියාපදිංචි කළ විට, පසුව සමිතියේ ලියාපදිංචිය අහෝසි විය යුතු බව.

(7) සමිතියක් සමාගමක් වශයෙන් ලියාපදිංචි වූයේ නම් හෝ සමාගමක් සමග ඒකාබද්ධ වන්නේ නම් හෝ එහි සියලු බැදීම් සමාගමකට මාරු කරයි නම් එවිට මේ ආඥාපනත යටතේ වූ ඒ සමිතියේ ලියාපදිංචි කිරීම බල රහිත විය යුතු අතර රෙජිස්ට්‍රාර් විසින් ඒ ලියාපදිංචිය අවලංගු කළ යුතුය; එනමුදු සමිතියක් සමාගමක් වශයෙන් ලියාපදිංචි කරනු ලැබීම, එවකට ඒ සමිතියට විරුද්ධ ව පවත්නා වූ යම් අයිතිවාසිකමක් කෙරෙහි, හෝ හිමිකම් ඉල්ලීමක් කෙරෙහි නැතහොත් තත් කාලයෙහි ඒ සමිතිය විසින් ලබා ඇති යම් දණ්ඩනයක් කෙරෙහි බල නො පෑ යුතු ය; එවැනි යම් අයිතිවාසිකමක්, හිමිකම් ඉල්ලීමක් හෝ දණ්ඩනයක් ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා, ඒ සමිතිය සමාගමක් වශයෙන් ලියාපදිංචි කර නො තිබුණේ නම් එයට විරුද්ධ ව සිවිල් නඩු පවරා ක්‍රියා කර ගෙන යන්නේ යම් ආකාරයකින් ද, ඒ ආකාරයෙන් ම එයට විරුද්ධ ව සිවිල් නඩු පවරා ක්‍රියා කළ හැකිය. තවද, සමාගමේ දේපළ සම්බන්ධයෙන්, එවැනි සෑම අයිතිවාසිකමකට හෝ හිමිකම්

ඉල්ලීමකට නැතහොත් එවැනි දණ්ඩනයකට බැඳී සිටීමකට, ඒ සමාගමට විරුද්ධ ව ඇති අන් සියලු ම අයිතිවාසිකම්වලට හෝ හිමිකම් ඉල්ලීම්වලට හෝ සමාගමේ සියලු ම බැඳීම්වලට වඩා පූර්වතාවය ලැබිය යුතු ය.

16. ලියාපදිංචි කළ සමිති විසුරුවා හැරීම සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන බලපැවැත්විය යුතුය :— සමිති විසුරුවා හැරීම.

(1) සමිතියක්—

(අ) සමිතියේ අවසාන වීම හැටියට ව්‍යවස්ථාවලින් ප්‍රකාශිත යම් සිද්ධියක් සිදු වූ විට ; හෝ

(ආ) සමාගම් සම්බන්ධයෙන් සමාගම් ආඥාපනත යටතේ නියම කොට ඇති පරිදි කරන ලද්දා වූත් ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු වූත්, සමිතියේ ගනුදෙනු බේරා වසා දැමීමට කරන ලද යම් නියෝගයකින් හෝ එය ගනුදෙනු බේරා වසා දැමීමට සම්මත කර ගන්නා ලද යම් යෝජනාවකින් ; හෝ

(ඇ) විසුරුවා හැරීමේ නීත්‍යනුකූල ලේඛනයකට අත්සන් තැබීමෙන් සාක්ෂි දරනු ලැබූ, සාමාජිකයන්ගෙන් ගතරෙන් තුන් කොටසගේ කැමැත්තෙන්,

අවසන් විය හැකි ය, නැතහොත් විසුරුවා හැරිය හැකි ය.

(2) සමිතියක් ගනුදෙනු බේරා වසා දමනු ලැබූ කල්හි සමිතියේ ණය තුරුස් හා බැඳීම් ද ගනුදෙනු බේරා වසා දැමීමේ වියදම් ද ගෙවීම සඳහාත් ආධාරකරුවන් අතර ඔවුන්ගේ අයිතිවාසිකම් ගැලපීම සඳහාත්, සිටින හෝ සිටි සාමාජිකයන් විසින් දායක මුදල් ගෙවීමට බැඳී සිටීම පහත සඳහන් අන්දමට සීමා විය යුතු ය :— සාමාජිකයන්ගේ බැඳීම.

(අ) ගනුදෙනු බේරා වසා දැමීම ආරම්භ වීමට පෙරාතුව ම වූ වර්ෂයක් හෝ ඊට වැඩි කාලයක් සාමාජිකත්වයෙන් ඈත් සිටි කිසි ම පුද්ගලයකු දායක මුදල් ගෙවීමට බැඳී නො සිටිය යුතු ය ;

(ආ) තමා සාමාජිකත්වයෙන් ඇරුණු පසු ඇති කර ගන්නා ලද කිසියම් ණයක් හෝ බැඳීමක් සම්බන්ධයෙන් දායක මුදල් ගෙවීමට කිසි ම පුද්ගලයකු බැඳී නො සිටිය යුතු ය ;

(ඇ) සිටින සාමාජිකයින්ගේ දායක මුදල් සමිතියට ඉදිරිපත් කොට ඇති සාධාරණ ඉල්ලීම් ඉටු කිරීමට ප්‍රමාණවත් නොවේ ය යි අධිකරණයට පෙනී ගියහොත් මිස, සාමාජිකයකු නො වන කිසි ම පුද්ගලයකු දායක මුදල් ගෙවීමට බැඳී නො සිටිය යුතු ය ;

(ඈ) සිටි හෝ සිටින සාමාජිකයකු හැටියට ගෙවීමට බැඳී ඇති මුදල ඉක්මවා යන දායක මුදලක් ගෙවීමට කිසි ම සාමාජිකයකුට නියම නො කළ යුතු ය;

(ඉ) පුද්ගලයකු සිය ඉල්ලා අස්වීමේ දැන්වීම හෝ ඉල්ලුම් කිරීම ඉදිරිපත් කළ දින පටන් ඔහු සාමාජිකත්වයෙන් ඇරුණු ලෙස ගණන් ගත යුතු ය :—

විසුරුවා හැරීමේ නීත්‍යානුකූල ලේඛනය.

(3) විසුරුවා හැරීමේ නීත්‍යානුකූල ලේඛනයකින් සමිතියක් විසුරුවා හරිනු ලබන විට පහත සඳහන් විධිවිධාන අදාළ විය යුතු ය :—

(අ) විස්තර වශයෙන් සමිතියේ බැදීම් සහ වත්කම් ද සාමාජිකයන්ගේ සංඛ්‍යාව සහ ඔවුන්ට සමිතියෙහි ඇති අයිතිවාසිකම්වල ස්වභාවය පිළිවෙළින් ද ණය හිමියන්ගේ (ණය හිමියන් ඇත්නම්) හිමිකම් ඉල්ලීම් සහ ඒ ඉල්ලීම් ගෙවා දැමීමට යොදනු ලබන්නා වූ වැඩ පිළිවෙළ සහ, රෙජිස්ට්‍රාර්ගේ තීරණයට තැබිය යුතු ය යි විසුරුවා හැරීමේ නීත්‍යානුකූල ලේඛනයෙහි සඳහන් වී නැත්නම් සමිතියේ අරමුදල් හා දේපල යොදවනු හෝ බෙදන්නට බලාපොරොත්තු වන ආකාරය ද විසුරුවා හැරීමේ නීත්‍යානුකූල ලේඛනයෙහි දැක්විය යුතු ය;

(ආ) මෙහි ඉහත සඳහන් විධිවිධාන සලසා ඇති පරිද්දෙන් ම කැමැත්ත ඇති ව අය එසේ දෙන් ම යගතික කොට, විසුරුවා හැරීමේ නීත්‍යානුකූල ලේඛනයෙහි වෙනස් කිරීම් කළ හැකි ය;

(ඇ) මේ අ ඥපනතේ විධිවිධාන පිළිපැද ඇති බවට සමිතියේ සාමාජිකයන් තිදෙනකු අත්සන් විසින් ප්‍රකාශයක් කොට, ඒ ප්‍රකාශය විසුරුවා හැරීමේ නීත්‍යානුකූල ලේඛනය සමග රෙජිස්ට්‍රාර් වෙත යැවිය යුතු ය; මේ කරුණෙහි දැන දැන ම අසත්‍ය හෝ වංචනික ප්‍රකාශයක් කරන සෑම තැනැත්තකු වුව ද වරදකට වරදකරු විය යුතු අතර වැරදි කරු ය යි ප්‍රකාශ කරනු ලැබූ විට, බරපතළ වැඩ ඇති ව හෝ නැති ව, දෙවර්ෂයකට දීර්ඝ විය හැකි කාලයකට, බන්ධනාගාරගත කිරීමෙන් හෝ දඩයකින්, එසේත් නැතහොත් ඒ දණ්ඩන දෙකෙන් ම ඔහුට දඬුවම් කළ හැකි විය යුතු ය;

(ඈ) විසුරුවා හැරීමේ නීත්‍යානුකූල ලේඛනය සහ එහි සියලු වෙනස් කිරීම්, ව්‍යවස්ථා ලියාපදිංචි කිරීම සඳහා මෙහි සලසා ඇති විධිවිධානවල ආකාරයට ම ලියාපදිංචි කළ යුතු අතර සමිතියේ සියලු ම සාමාජිකයන් ඉන් බැඳිය යුතු ය;

(ඉ) විසුරුවා හැරීම පිළිබඳ දැන්වීමක් රෙජිස්ට්‍රාර් විසින් සමිතියේ වියදමින් ගැසට් පත්‍රයෙහි සහ කොළඹ දිනපතා පුවත් පත් අතුරින් එකක ප්‍රසිද්ධ කරවිය යුතු ය. ඒ ප්‍රසිද්ධ කිරීම පළ වූ ගැසට් පත්‍රයේ දිනයෙන් තුන් මසක් ඇතුළත සාමාජිකයකු විසින්

හෝ සමිතියේ අරමුදල් කෙරෙහි සැලකිල්ලක් දක්වන නැතහොත් එහි ලා යම් ශ්‍රම්කමක් දරන වෙන යම් තැනැත්තකු විසින් සමිතිය විසුරුවා හැරීම අවලංගු කරවීමට සමිතියේ ලියාපදිංචි කළ කාර්යාලය පිහිටි ප්‍රදේශය අධිකරණයෙහි නීති කෘත්‍යයක් ආරම්භ කළහොත් සහ එනයින් ඒ විසුරුවා හැරීම අවලංගු කරනු ලැබුවහොත් මිස, එකී දැන්වීමේ දිනයෙහි පටන් සමිතිය නීත්‍යානුකූල ම විසුරුවා හැරියා විය යුතු ය. එසේ ම, විසුරුවා හැරීමේ නීත්‍යානුකූල ලේඛනයක් සඳහා ලබා ගැනීමට අවශ්‍ය නැමැත්ත, එයට තබන ලද අත්සන් පිළිබඳ ඔප්පු කිරීමක් නොමැති ව, යථා පරිදි ලබා ගන්නා ලද සි ද සැලකිය යුතු ය ;

(ඊ) සමිතියක් විසුරුවා හැරීම අවලංගු කිරීම පිණිස යම් ක්‍රියා මාර්ගයක් ගැනීමේ දී, ඒ පිළිබඳ දැන්වීමක්, එය ආරම්භ වීමට සත් දිනකට නො අඩු කාලයකට පෙර, එය ගන්නා තැනැත්තා විසින් ද, විසුරුවා හැරීම අවලංගු කරන යම් නියෝගයක් වූ විට, ඒ පිළිබඳ දැන්වීමක්, ඒ නියෝගය කිරීමෙන් සත් දිනක් ඇතුළත සමිතිය විසින් ද රෙජිස්ට්‍රාර් වෙත යැවිය යුතු ය.

17. ලියාපදිංචි කළ සමිතියක කිසි ම සාමාජිකයකු හෝ සාමාජිකයකු මාර්ගයෙන් හිමිකම් ඉල්ලන කිසි ම තැනැත්තකු එවැනි යම් එක් සමිතියකින් නැතහොත් සමිති ගණනාවකින් සම්පූර්ණ මුදල වශයෙන් රුපියල් දෙදහසකට සහ ඒ සමග, ඒ මුදල ඉක්මවා නො යන, සභාතික පිට ප්‍රකාශ කරන ලද, ප්‍රසාද මුදල් හෝ වෙනත් එක්වීම් කිසිවක් ඇතොත් ඒවාට නැතහොත් වාර්ෂිකයක් වශයෙන් වර්ෂයට රුපියල් පන්සියයකට වැඩි මුදලක්, ලැබීමට හිමිකම් නො ලැබිය යුතු ය. තවද, එබඳු සාමාජිකයකුට හෝ සාමාජිකයකු මාර්ගයෙන් හිමිකම් ඉල්ලන තැනැත්තකුට එවැනි එක් සමිතියකින් හෝ සමිති ගණනකින් ලැබීමට හිමිකම් ඇත්තා වූ මුළු මුදල පූර්වෝක්ත ගණන් ඉක්මවා නො යන බවට ප්‍රකාශයක් කොට අත්සන් කරන මෙන් යම් සමිතියක් විසින් ඒ සාමාජිකයාට හෝ තැනැත්තාට නියම කළ හැකි ය ; එවැනි යම් සාමාජිකයකුට හෝ තැනැත්තකුට එක් සමිතියකින් හෝ සමිති ගණනකින් හිමිකම් ඇති මුළු මුදල ඉහත කී ගණන් ඉක්මවා නො යන්නේ ය යි දැන දැන ම, අසත්‍ය හෝ වංචනික ප්‍රකාශයක් කරන කවර තැනැත්තකු වුව ද වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු ය යි ප්‍රකාශ කරනු ලැබූ විට, බරපතළ වැඩ ඇති ව හෝ නැති ව, දෙවර්ෂයකට දීර්ඝ විය හැකි කාලයකට, බන්ධනාගාරගත කිරීමෙන් නැතහොත් දඩයකින්, එසේ නැතහොත් ඒ දණ්ඩන දෙකෙන් ම, ඔහුට දඬුවම් කළ හැකි විය යුතු ය. ප්‍රතිලාභ පිළිබඳ සීමා.

18. මුදල් ඇමතිවරයාගේ සමගාමිත්වය ඇති ව ඇමතිවරයා විසින් කලින් කල මේ ආඥාපනතේ කාර්යයන් සඳහා ප්‍රසිද්ධ ගණන් පරීක්ෂකයන් සහ තක්සේරුකරුවන් පත් කළ හැකි ය. තවද, ඔහු විසින්, එවැනි ගණන් පරීක්ෂකයන්ගේ සේවාවන් සඳහා සමිති ප්‍රසිද්ධ ගණන් පරීක්ෂකවරු.

විසින් ඔවුන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය ද කලින් කල නිර්ණය කළ හැකි ය.

ගාස්තු.

19. මුදල් ඇමතිවරයාගේ සමගාමිත්වය ඇති ව ඇමතිවරයා විසින්, මේ ආඥාපනත යටතේ කළ යුතු කටයුතු සඳහා හෝ ලේඛන පරීක්ෂා කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු පිළිබඳ පරිමාණයක් නිර්ණය කළ හැකි ය. මේ ආඥාපනත යටතේ රෙජිස්ට්‍රාර් විසින් ලැබිය හැකි සියලු ගාස්තු භාණ්ඩාගාරයට ගෙවිය යුතු ය.

ආඥාපනත ක්‍රියාත්මක කිරීමට නියෝග පැනවිය හැකි බව.

20. (1) මේ ආඥාපනත යටතේ ලියාපදිංචි කිරීම සහ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද එසේ ලියාපදිංචි කිරීම සඳහා පාවිච්චි කළ යුතු ආකෘති සම්බන්ධයෙන් ද මේ ආඥාපනත යටතේ රෙජිස්ට්‍රාර්ගේ යුතුකම් හා කාර්යයන් සහ රෙජිස්ට්‍රාර් විසින් තබනු ලබන ලේඛන පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් මේ ආඥාපනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ද ඇමතිවරයා විසින් කලින් කල නියෝග පැනවිය හැකි ය.

(2) එවැනි සියලු නියෝග ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය.

(3) අන් අයුරකින් විධිවිධාන සලසා නැත හොත්, උපලේඛනයෙහි ඇතුළත් ආකෘති පාවිච්චි කළ යුතු ය.

ලේඛන සාක්ෂි.

21. රෙජිස්ට්‍රාර්ගේ අත්සන දරන සෑම නීත්‍යනුකූල ලේඛනයක් හෝ යම් ලේඛනයක් එවැනි නීත්‍යනුකූල ලේඛනයක් හෝ යම් ලේඛනයක සෑම පිටපතක් හෝ උද්ධෘතයක්, තවදුරටත් ඔප්පු කිරීමක් නොමැති ව ම සාක්ෂි හැටියට පිළිගත යුතු ය; එසේ ම, මේ ආඥාපනත යටතේ රෙජිස්ට්‍රාර් විසින් හෝ යම් පරීක්ෂකයකු හෝ ප්‍රසිද්ධ ගණන් පරීක්ෂකයකු හෝ තක්සේරුකරුවකු විසින් අත්සන් කරන ලද යි හැඟවෙන සෑම ලේඛනයක්, එසේ නො වන බවට යම් සාක්ෂියක් නොමැති කල්හි, අත්සන පිළිබඳ ඔප්පු කිරීමක් නො මැතිව ම සාක්ෂි හැටියට පිළිගත යුතු ය.

වැරදි

22. පහත සඳහන් ක්‍රියාවන් මේ ආඥාපනත යටතේ වැරදි හැටියට ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) නොමඟ යැවීමේ හෝ වංචා කිරීමේ අදහසින්, යම් තැනැත්තෙක් ලියාපදිංචි කළ සමිතියක පවත්නා ව්‍යවස්ථා ය යි හෝ ඒ හැර ඒ සමිතියට වෙනත් ව්‍යවස්ථා නැතැ යි හෝ මේ ආඥාපනත යටතේ එකලට ලියාපදිංචි කර තිබෙන ප්‍රමාණවත් නො වන්නා වූ ව්‍යවස්ථා, නීති, නියෝග හෝ වෙනත් යම් ලේඛන කිසිවක් අන් කිසි තැනැත්තකුට දෙයි නම් හෝ සමිතියක් ලියාපදිංචි කර නොමැති විට ඒ සමිතියේ ලියාපදිංචි කළ ව්‍යවස්ථා ය යන ව්‍යාජයෙන් කිසියම් ව්‍යවස්ථා පිටපතක් යම් තැනැත්තකුට දෙයි නම්;

(ආ) යම් තැනැත්තෙක් වැරදි කරුණු ඇඟ කර සිටීමෙන් හෝ රැවටිල්ලෙන් සමිතියක් සතු යම් දේපළක අයිතිය ලබා ගනියි නම් හෝ එහි අයිතිය තමන් වෙත ඇති ව එය නො දී සිටියි නම් හෝ නැතහොත් වැරදි ලෙස යොදයි නම් හෝ එහි යම් කොටසක් සමිතියේ ව්‍යවස්ථාවලින්

ප්‍රකාශිත හෝ නියම කර ඇත්තා වූත් මේ ආඥාපනතින් බලය දී ඇත්තා වූත් කාර්යයන් නො වන කාර්යයන් සඳහා ඕනෑ කමින් යොදයි නම්;

(ඇ). වරදවා පෙන්වීමේ අදහසින් හෝ මේ ආඥාපනතේ විධිවිධාන කිසිවක් මග හැරීමේ අදහසින් යම් තැනැත්තෙක් මේ ආඥාපනතේ කාර්යයන් සඳහා යැවීමට, ඉදිරිපත් කිරීමට නැතහොත් භාර දීමට නියමිත ලියාපදිංචි කළ සමිතියක යම් ශේෂ පත්‍රයක හෝ යම් දායක මුදල් පොතක හෝ එකතු කිරීමේ පොතක නැතහොත් යම් වාර්තාවක හෝ ලේඛනයක ඕනෑකමින් ම යම්කිසි සටහනක් හෝ මකා හැරීමක් හෝ අත් හැරීමක් කරයි නම් නැතහොත් එසේ කිරීමට අණ කරයි නම් හෝ ඉඩ දෙයි නම්;

(ඈ) සමිතියේ යම් නිලධාරියෙක් හෝ සමිතිය වෙනුවෙන් යම් තැනැත්තෙක් සමිතියේ මුද්‍රාවක් ය යි හඟවමින්, ඇඟත කී පරිදි එහි නම නො එබ්බ වූ මුද්‍රාවක් පාවිච්චි කරයි නම් නැතහොත් ඉහත කී ආකාරයට සමිතියේ නම සඳහන් ව නැති යම් දැන්වීමක්, ප්‍රසිද්ධ දැන්වීමක් හෝ සමිතියේ වෙන යම් නිල ප්‍රකාශනයක් නිකුත් කරයි නම් හෝ නිකුත් කිරීමට බලය පවරයි නම් නැතහොත් සමිතිය වෙනුවෙන් එබඳු යම් විනිමය පත්‍රයක්, පොරොන්දු නෝට්ටුවක්, සහතික සටහනක්, චෙක්පතක් හෝ මුදල් හෝ බඩු සඳහා වූ ඇණවුමක් අත්සන් කරයි නම් හෝ අත්සන් කිරීමට බලය පවරයි නම් නැතහොත් සමිතියේ පාර්සල් බිල් පත්‍ර, බඩු විස්තර ලේඛන, කුවිතාන්සි හෝ ණයවර ලිපි කිසිවක් එසේ නිකුත් කරයි නම් හෝ නිකුත් කිරීමට බලය පවරයි නම්;

(ඉ) ලියාපදිංචි කළ සමිතියකට හෝ එහි ශාඛාවට හෝ නිලධාරියකුට හෝ සාමාජිකයකුට රෙජිස්ට්‍රාර් විසින් විශේෂයෙන් ලියවිල්ලකින් ඉල්ලීමක් කළ පසු සති හයක කාල සීමාවක දී, සමිතිය, ශාඛාව, නිලධාරියා හෝ සාමාජිකයා විසින් දිය යුතු ය යි, යැවිය යුතු ය යි, කළ යුතුය යි හෝ කිරීමට ඉඩ යුතු ය යි, යැවිය යුතු ය යි, කළ යුතු යයි හෝ කිරීමට ඉඩ කිරීමට හෝ යම් වාර්තාවක්, ප්‍රකාශයක් හෝ ලේඛනයක් යැවීමට හෝ යමක් කිරීමට හෝ කිරීමට ඉඩ දීමට නොහැකි වූවහොත් වේ.

තවද, එවැනි සෑම වරදකට ම රුපියල් සියය නො ඉක්ම වන දඩයකින් හෝ බරපතල වැඩ ඇති ව හෝ නැති ව, තුන් මාසයකට දීර්ඝ විය හැකි කාලයකට, බන්ධනාගාරගත කිරීමෙන් හෝ ඒ දණ්ඩන දෙකෙන් ම හෝ දඬුවම් කළ යුතු ය;

එසේ වුව ද මේ ආඥාපනත යටතේ වරදකට වරදකරු වූ යම් තැනැත්තෙක් එ වරද ම සම්බන්ධයෙන් මේ ආඥාපනතේ විධිවිධාන යටතේ කලින් වරදකරුවකු කරනු ලබා නොමැත්තේ නම්, මෙහි අන්තර්ගත කිසිවක්, ඔහුට විරුද්ධ ව දණ්ඩ නීති සංග්‍රහය යටතේ අපරාධ නඩු පවරනු ලැබීමෙන් නො වැළැක්විය යුතු ය;

තවද එසේ ම (ඉ) ඡේදයෙහි විස්තර කර ඇති වැරදි සම්බන්ධයෙන්, අධිකරණයක නඩු පවරනු වෙනුවට, කරන ලද වරද සමථයකට පැමිණවීම වශයෙන්, ඒ වරදට දඬුවම් ලැබීමට බැඳී සිටින සමිතියෙන් හෝ ශාඛාවෙන් හෝ නිලධාරියාගෙන් හෝ සාමාජිකයාගෙන් රුපියල් සියයක් ඉක්මවා නොයන තමන්ට සුදුසු යයි හැඟෙන මුදලක් රෙජිස්ට්‍රාර් විසින් භාර ගත හැකි ය; තවද එසේ එවැනි බේරුමක් පිළිගත් විට ඒ වරද සම්බන්ධයෙන් ඒ සමිතියට හෝ ශාඛාවට හෝ නිලධාරියාට හෝ සාමාජිකයාට විරුද්ධ ව වෙන යම් නඩු නො පැවරිය යුතු ය, නැතහොත් පවත්වාගෙන නො යා යුතු ය.

සමිතිය විසින් කෙරෙන වැරදි වෙනුවෙන් බැඳී සිටින්නෝ.

23. ලියාපදිංචි කළ සමිතියක් මේ ආඥාපනත යටතේ වරදකට වරදකරු වූ විට, වරද වී ඇත්තේ යම් යුතුකමක් ඉටු කිරීම ද ඒ යුතුකම ඉටු කිරීමට සමිතියේ ව්‍යවස්ථාවලින් බැඳී සිටින සමිතියේ ලේකම් හෝ අන් කිසි නිලධාරියෙකු නම් ඔහු, [illegible] ඒ වරද කර ඇත්තා සේ එම දඬුවමට යටත් විය යුතු ය.

(7 වගන්තිය)

## උපලේඛනය

මේ ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලබන සමිතිවල ව්‍යවස්ථාවලින් විධිවිධාන සැලසිය යුතු කරුණු.

1. සමිතියේ නම සහ සමිතියේ කාර්යාලය පිහිටි ස්ථානය.

2. සමිතිය පිහිටුවීමේ සියලු පරමාර්ථ, එහි අරමුදල් යෙදිය යුතු කාර්යයන්, සාමාජිකයන් ඇතුළත් කර ගැනීමේ නියමයන්, සමිතියෙන් සපයන කෙරෙන යම්කිසි ප්‍රතිලාභයකට යම් සාමාජිකයෙක් හිමිකම් ලබන්නේ නම් එබඳු කොන්දේසි යටතේ ද ඒ කොන්දේසි, සහ යම්කිසි සාමාජිකයකුට නියම කළ හැකි දඩ සහ අහිමි කිරීම්.

3. සභා රැස්වීම් පැවැත්වීමේ ක්‍රමය සහ ඡන්දය දීමේ අයිතිය, සහ ව්‍යවස්ථා ඇති කරන, වෙනස් කරන හෝ අවලංගු කරන ආකාරය.

4. කළමනාකාර කාරක සභාවක් (කවර නමකින් වුව ද), භාණ්ඩාගාරිකයකු හෝ වෙනත් නිලධාරීන් සහ භාරකරුවන් පත් කිරීම සහ ඉවත් කිරීම, සහ ඇති සමිතියක් වූ කල්හි ඔවුන්ගේ බලතල සම්බන්ධව වූ ආකාරය සහ සාමාජික සමිතියන් ඉවත් වීමේ දී ගෙවිය යුතු කොන්දේසි.

5. අරමුදල් ආයෝජනය කිරීම, ගිණුම් තබා ගැනීම සහ වර්ෂයකට වරක්වත් ගිණුම් පරීක්ෂා කිරීම.

6. සමිතියේ අය, අරමුදල්, ණය බැඳීම් සහ වියදම් ද සාමාජික සංඛ්‍යාව ද පිළිබඳ ව රෙජිස්ට්‍රාර් වෙත යැවිය යුතු වාර්ෂික වාර්තා.

7. සමිතියේ අරමුදල් පිළිබඳ සැලකිල්ලක් දක්වන ඇම [illegible] පොත් පරීක්ෂා කිරීම.

8. සමිතිය හා එහි කවර සාමාජිකයකු හෝ සාමාජිකයකුගේ නැතහොත් ව්‍යවස්ථා යටතේ හිමිකම් ඇති යම් තැනැත්තකු අතර ආරවුල් නිරවුල් කළ යුතු ආකාරය.

[11 (3) වගන්තිය]

## බැදුම්කරයේ ආකෘතිය

සියලු දෙනා ම විසින් මෙයින් දත යුතු වන සැටි නම්.............................................................සහ පදිංචිය පිහිටුවන ලද.............................................................නමැති සමිතියේ නිලධාරියකු වූ.............................................................වූ මා ඒ. බී. සහ (එකී ඒ. බී. වෙනුවෙන් ඇපකරු හැටියට) .............................................................සහ ..... සී. ඩී. යන අපි එකී සමිතියට රුපියල්.............................................................ක මුදලක් ගෙවීමට ඒ සමිතියට එක් ව හා වෙන් වෙන් වශයෙන් ස්ථිරවම ඒ මුදලින් බැඳී සිටින බව මෙයින් දන්වමු. තවද එසේ ම, නිසියාකාරව හා සත්‍ය ලෙස ගෙවිය යුතු ඒ මුදල වෙනුවෙන් අප

සහ අද එක එක්කෙනා ද අපගේ සහ අප එක එක්කෙනාගේ උරුමක්කාරයින්, බුද්ධි පරිපාලකයින් සහ පරිපාලකයන් ද එක් ව හෝ වෙන් වෙන් වශයෙන් බැඳී ඇත්තෙමු.

වර්ෂ 19......ක් වූ ............................ මස ...... වෙනි දින වූ මේ දින අත් සන් කොට දින යොදන ලදී.

පූර්වෝක්ත පරිදි බැඳුණු ඒ. බී. ඉහත කියන ලද පරිදි පත්වුණු ලැබූ ................ ................ නාමැති සමිතියේ ................................ බුරයට සඳහා පරිදි පත් කරනු ලැබ සිටින හෙයින් ඔහු හා, ඔහු සමග ඔහුගේ ඇපකරුවන් වශයට පූර්වෝක්ත පරිදි බැඳුණු සී. ඩී., මින් මතු මෙහි අඩංගු කොන්දේසි යටතේ, ඉහතින් කියන ලද බැඳුම්කරයට ඇතුළත් වූවාහු වෙති;

එ හෙයින්, ඒ ඉහතින් කියන ලද බැඳුම්කරයේ කොන්දේසි කවරේ ද යත්, එකී ඒ. බී. එකී සමිතියේ ගණනාව, තමන් විසින් භාර ගන්නා වූ හෝ ගෙවන්නා වූ සියලු මුදල් පිළිබඳ සාධාරණ හා සත්‍ය ගිණුම් පොත්වලින් ඒ සමිතියේ ව්‍යවස්ථා වලින් නියම කෙරෙන කාල වේලාවන්හි දී කෙලේ වී නම් යන එකී සමිතියේ ව්‍යවස්ථා ප්‍රකාර ඒ සමිතිය විසින් පත් කරනු ලබන තැනැත්තාට හෝ තැනැත්තන්ට, ඒ පෙළම් සඳහා සිසි යන නීත්‍යානුකූල කුවිතාන්සි හෝ වවුචර ද සමග, තමන් අත ඉතිරි ව ඇත්තා වූ සියලු මුදල් ගෙවා තමන් අත හෝ භාරයේ පවතින සමිතියේ සතු (පොත් පත ලිපි ගොනු ඇතුළු ව) සියලු දේපළ භාර කර දුන්නේ වී නම් තැනැත්තන් ලැබුණු කළේ වී නම් තැනැත්තෙන් භාර දුන්නේ වී නම් එවිට ඉහත කියන ලද බැඳුම්කරය අහෝසි විය යුතු ය; එසේ නොවේ වී නම්, එය සම්පූර්ණ බල සහිත ව බලාත්මක ව පැවතිය යුතු ය.

සාක්ෂිකරුවන් (දෙදෙනකු) ඉදිරිපිට අත්සන් කොට භාර දෙන ලදී.

උක්ත හෝ වෙනත් ගණිකයෙක් විසින් කළ යුතු සහතික කිරීමේ ආකෘතිය

.................... ................................ සමිතිය, මෙහි (හෝ මෙහි ඉහත) ලියන ලද බැඳුම්කරයන් ලැබීමට බලාපොරොත්තු වූ සියලු මුදල් ලැබුණු බව, මෙයින් සහතික කරමි.

අත් සන් : (කාරක සභිකයන් දෙදෙනකුගේ අත් සන්)

අනුමත සහ : (සමිතියේ අත් සන).

................................................

ලේකම්.

ලියාපදිංචි කළ බව දැන්වීම

........ .. ................................................ සමිතිය 19...... ක් වූ ................................ මස ...... වෙනි දින වූ මෙදින සමිති ආඥාපනත යටතේ සමිතියක් ලෙසින් ලියාපදිංචි කරන ලදී.

................................................

සමිති රෙජිස්ට්‍රාර්.

ව්‍යවස්ථා සංශෝධන ලියාපදිංචි කළ බව දැන්වීම

................................................ සමිතියේ ව්‍යවස්ථා පිළිබඳ ඉහත සඳහන් සංශෝධනය වර්ෂ 19......ක් වූ ............................ මස ...... වෙනි දින වූ මෙදින සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලදී.

................................................

සමිති රෙජිස්ට්‍රාර්.